# 2013 – 04 – 02 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

# මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| 1. | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 2. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ. ජී. ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| 4. | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 5. | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 6. | ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 7. | ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 8. | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 9. | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 10. | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 11. | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 12. | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**(01)**

**01:01 2013 – 03 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2013 – 03 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිලිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් යෝජනා කල අතර ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 03 – 05 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** " සංචාරක හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම- අම්බලන්ගොඩ තානායම් භූමිය " මැයෙන් 2013-03-13 දාතමින් දකුණු පළාත් සහකාර ලේකම් තුමා විසින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ තානායම් භූමියේ හෝටල් සංකීර්ණයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා ඇස්කොට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගමට වසර 50 ක කාලයකට බදු දීමටත් යෝජිත බදු ගිවිසුමේ කොන්දේසි වලට යටත්ව නගර සභා ආඥා පනතේ 36 (ඉ) (II) වගන්තිය යටතේ දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව දන්වා තිබුණි.

<u>**තීරණය**</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී .**

**3:2** " දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය " මැයෙන් ධර්මාශෝක විද්‍යාලීය ආදිශිෂ්‍ය සංගමය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙම සැණකෙළියට සමගාමීව ලයන් බ්‍රෙවරි (සිලෝන්) පුද්ගලික සමාගමේ බියර් අලෙවි හලක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා සුරාබදු කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු බවත් එම අනුමැතිය ලබා ගැනීමට සුරාබදු කොමසාරිස් වරයාට ඉදිරිපත් කිරීම සඳහා ඒ සඳහා අවසර ලබාදී ලිපියක් නිකුත් කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

මෙම ලිපියට සභාවේ අවසරයකින් තොරව අනුමැතිය ලබා දීම මම කරෙ නැහැ. ඉන් පසු මන්ත්‍රීවරුන් අට දෙනෙකු විසින් අත්සන් කරල එකගතාවය පල කරල මා වෙත ඉදිරිපත් කරල තියෙනවා. ඒ අනුව සභා අනුමැතියට යටත්ව එකගතාවය පල කරල ලිපියක් නිකුත් කරන්න අවසර දුන්නා.

<u>**තීරණය**</u>

☞ **දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළියේ බියර් අලෙවිහලක් ස්ථාපනය කිරීමට සභා අනුමැතියට යටත්ව ගරු මන්ත්‍රීවරුන් අට දෙනෙකුගේ අත්සනින් යුතුව ලබා දුන් අවසරය වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:3** “ අන්තර් යෞවන සමාජ ක්‍රීඩා උළෙල 2013 ” මැයෙන් 2013-03-06 දාතමින් අම්බලන්ගොඩ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

2013 වසරේ පවත්වනු ලබන ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ එල්ලේ තරග 2013- 03- 17 දින පෙ. ව. 8.00 සිට ප. ව. 5.30 දක්වා මානාන ක්‍රීඩාපිටියේදී පැවැත්වෙන බවත් ඒ සඳහා ගාස්තු අය කිරීමකින් තොරව ක්‍රීඩා පිටිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ තරග පැවැත්වීම සඳහා 2013-03-17 දින මානාන ක්‍රීඩාංගණය නොමිලේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:4** “ ධීවර සංකීර්ණ රැස්වීම් ශාලාව වෙන් කරවා ගැනීම සඳහා ” මැයෙන් 2013-03-18 දාතමින් අම්බලන්ගොඩ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, ප්‍රදේශයේ කුඩා ව්‍යාපාර වැඩි දියුණු කිරීමේ අරමුණින් පසුවන පිරිස් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2013 මාර්තු 19 වන දින පැවැත්වෙන බවත් ඒ සඳහා ධීවර සංකීර්ණ ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ව්‍යාපාරික පිරිස් දැනුවත් කිරීමේ සාකච්ඡාව සඳහා 2013-03-19 දින ධීවර සංකිර්ණ ශාලාව නොමිලේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:5** “ පොල්වත්තපුර නිවාස යෝජනා ක්‍රමයේ ඔප්පු ලබා දීම සම්බන්ධව ” මැයෙන් 2013-03-05 දාතමින් අම්බලන්ගොඩ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස්තුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

පොල්වත්තපුර නිවාස යෝජනා ක්‍රමයේ පදිංචි අයට මේ දක්වා ඔප්පු ලබා දී නොමැති බවත් මෙම නිවාස යෝජනා ක්‍රමයට අදාලව නගර සභාව විසින් ඉදිරිපත් කර ඇති පැවරුම් නියෝග හා ඊට අදාල සැළැස්ම මෙම යෝජනා ක්‍රමය පිහිටි භූමියට සම්බන්ධ ඉඩමක් නොවන බවත් මෙම නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධ මෙයට අමතරව කිසිඳු ලියවිල්ලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නොමැති අතර මෙහි පදිංචිකරුවන් සඳහා ඔප්පු ලබා දීමට ගතයුතු ඉදිරි උපදෙස් කඩිනමින් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**3:6** “ නගර ශාලාව වෙන් කරවා ගැනීම සම්බන්ධව ” මැයෙන් 2013-03- 11 දාතමින් අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

පුරසරණී කලා සංසදයේ කලා මංගල්‍යය 2013- 03- 16 දින ප. ව. 3.00 ට පැවැත්වෙන බවත් ඒ සඳහා නගර ශාලාව, පුටු, පොල්තෙල් පහන සහ ශබ්ද විකාශන යන්ත්‍ර ගාස්තු අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>**තීරණය**</u>

☞ **දින පුරසරණී කලා මංගල්‍ය සඳහා නගර ශාලාව නොමිලේ ලබා දීමට සහා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:7** “ එඬේරමුල්ල පාර ආර්. ඒ. මැන්දිස් සිල්වා මාවත ලෙෂ නම් කරන ලෙෂ ඉල්ලා ඉදිරිපත් කර ඇති පෙත්සම - එල්. ඒ. බන්දුල සිල්වා මහතා, අංක 05, එඬේරමුල්ල, අම්බලන්ගොඩ ” මැයෙන් 2013-03-20 දාතමින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමා විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මැතිතුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

2011- 06- 10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් පෙත්සම 2013- 02- 07 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී දෙවන වරටද සලකා බලනු ලැබූ බවත් මේ සම්බන්ධයෙන් අල්ලස් කොමිසම මගින් පරීක්ෂණ පවත්වාගෙන යන බැවින් කාරක සභාව මෙම පෙත්සමට මැදිහත් නොවීමට තීරණය කල බවත් එමෙන්ම ප්‍රධාන මාර්ගය වෙනුවට පෙත්සම්කරු කැමති නම් එම ප්‍රදේශයේ වෙනත් පාරක් නම් කිරීම වෙනුවෙන් නගර සභා පනතට අනුව නිසි යෝජනාවක් ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් නිලධාරීන්ට පවසමින් පෙත්සමෙහි කටයුතු අවසන් කල බවත් දන්වා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි අල්ලස් හා දූෂණ කාටද ඒක ඇවිල්ල තියෙන්නෙ.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

බන්දුල මහතා විසින් අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවටත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පෙත්සම් කාරක සභාවටත් පැමිණිල්ලක් කරල තියෙනව මේ නම දාන්න කියල සභාව තීන්දු කරාය ඊට පස්සෙ ඒ නම නොතිබීම සම්බන්ධයෙන් පැමිණිලි කරල තියෙනවා. ඒ අනුව අපේ සභාවෙන් හා නිලධාරීන්ගෙන් මේ පාර නම් නොකිරීම සම්බන්ධයෙන් යම් දූෂණයක් සිදු වෙලා තියෙනවද කියල සොයා බලනව. ඇත්තවශයෙන්ම මෙතන කිසිම දූෂණයක් වංචාවක් සිදු වුනේ නැහැ. මහජනතාවගේ විරෝධතාවය නිසා සභාවට එය ඉවත් කරන්න සිදු වුනා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

ඔය පාර රජයට පවරාගත්ත පාරක්ද සභාපතිතුමනි. ඒ මහත්මය මට කතා කරල කිව්ව එගොල්ලන්ගෙ පාරක් විදියටයි කියල තාම තියෙන්නෙ. මම කිව්ව මේක අඩි 30 කට රජයට පවර ගත්ත පාරක් කියල. එයා කිව්ව එහෙම නැතෙයි කියල.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විශේෂ කොමසාරිස්තුමා විසින් ඒ කාලෙ පවරගෙන තියෙනවා. වන්දි ගෙවීම් සියල්ල කරල තියෙනවා. මේකෙ පොඩි ප්‍රශ්නයක් තියෙනව පැවරුම් නියෝග දීල නැහැ. 1969 භුක්තිය භාර දීල තියෙනව. ඒ පාර තමයි අපි හදන්න ගියේ. එතකොටත් පෙත්සමක් ගැහුව ඔබතුමාල. ඒක අපි සත් භාවයෙන් කරපු ක්‍රියාවක්. හරි විදියට කිරීමට 44 වන වගන්තිය යටතේ අපිට පැවරුම් නියෝගය දීල තියෙන්න ඕනෙ. ඒ නියෝගය නිසි විදියට අපිට ලැබිල නැහැ. එය ලබා ගැනීමෙන් පසුව තමයි නීත්‍යානුකූලව කටයුතු කිරීමේ හැකියාව තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒකෙ පැවරුම් නියෝගයක් නැතෙයි කියල කියන්න බැහැ. පාර පළල් කරේ නගර සභාවෙන්.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

භුක්තිය හිටන් භාරදීල තියෙනවා. ඊට පස්සෙ දිසාපතිතුමාගෙ වගකීම තමයි එම භාර දුන්න භුක්තිය ලියාපදිංචි කරන්න ඕනෙ ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ. ඊට පස්සෙ 44 වගන්තියේ නියෝගය අපිට එවන්න ඕනෙ. ඊට පසුව ඒ සෑම කෙනාම ඔප්පුව යටින් සඳහන් කරනව මේක නගර සභාව සතුයි කියල. මේ ක්‍රියා පිළිවෙල දැනට අපි කරගෙන යනවා. මේකෙ ඒක කරල නෑ. අවුරුදු හතලිහක් විතර. ඒක නගර සභාවෙ වරදක් නෙමෙයි දිසාපතිතුමාගෙ වරදක්. නමුත් නගර සභාවෙ ඒ කාලෙ ඉඳපු නිලධාරීනුත් ඒක උනන්දු වෙලා කරගෙන නැහැ.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

🕘 **පෙ. ව. 09.45 ට පමණ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

🕘 **පෙ. ව. 09.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ    නැත

**(05)** **යථා පරිදි කල්දී ඇති යෝජනා**

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා - නැත**

**5:2** **නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**5:2:1** **ප්‍රධාන ආදායම් නිලධාරීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා.**

**" පොල්වත්ත ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ, පිඹුරු අංක 950 කැබලි අංක 01 (පර් 07. 00) ඉඩම් කැබැල්ල 2011- 01- 03 දින පැවති නිවාස කමිටු වාර්තාව අනුව පී. එච්. ජගත් මහතාට ලබා දීමට මෙම සභාවට යෝජනා කරන්නීය."**

**පොල්වත්ත ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ, පිඹුරු අංක 950 කැබලි අංක 01 (පර් 07. 00) ඉඩම් කැබැල්ල 2011- 01- 03 දින පැවති නිවාස කමිටු වාර්තාව අනුව පී. එච්. ජගත් මහතාට ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මීට අවුරුදු තුන හතරකට උඩදි තමයි මේක යවල තියෙන්නෙ. නමුත් මේ යෝජනාව එවපු විදිය වැරදියි කියල තමයි ආපහු මෙහාට එවල තියෙන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේකෙ වෙලා තියෙන්නෙ ඔප්පු දෙක මාරු වෙලා දීල තියෙන්නෙ ඒ කාලෙ. ඒ අනුව සහකාර කොමසාරිස් කාර්යාලයෙන් අඩුපාඩු දන්වල එවල තියෙනවා. නිසි විදියට යෝජනාව කරල එවන්න කියල.

<u>තීරණය</u>

☞ **ඒ අනුව පොල්වත්ත ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ, පිඹුරු අංක 950 කැබලි අංක 01 (පර් 07. 00) ඉඩම් කැබැල්ල 2011- 01- 03 දින පැවති නිවාස කමිටු වාර්තාව අනුව පී. එච්. ජගත් මහතාට ලබා දීමට සුදුසු බවට සභාව තීරණය කරන ලදී.**

**5:2:2** **ප්‍රධාන ආදායම් නිලධාරිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා.**

**" පොල්වත්ත ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ, පිඹුරු අංක 950 කැබලි අංක 15 (පර. 10.18) ඉඩම් කැබැල්ල 2011- 01- 03 දින පැවති නිවාස කමිටු වාර්තාව අනුව ගලගමගේ ලහිරු රසන්ත මහතාට ලබා දීමට මෙම සභාවට යෝජනා කරන්නීය."**

**පොල්වත්ත ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ, පිඹුරු අංක 950 කැබලි අංක 15 (පර. 10.18) ඉඩම් කැබැල්ල 2011- 01- 03 දින පැවති නිවාස කමිටු වාර්තාව අනුව ගලගමගේ ලහිරු රසන්ත මහතාට ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>තීරණය</u>

☞ **ඒ අනුව පොල්වත්ත ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ, පිඹුරු අංක 950 කැබලි අංක 15 (පර. 10.18) ඉඩම් කැබැල්ල 2011- 01- 03 දින පැවති නිවාස කමිටු වාර්තාව අනුව ගලගමගේ ලහිරු රසන්ත මහතාට ලබා දීමට සභාව තීරණය කරන ලදී.**

🕘 **පෙ. ව. 09.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 02- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**දිනය** : 2013.03.05
**ස්ථානය** : නගර සභාව, අම්බලන්ගොඩ
**වේලාව** : පෙ.ව. 02.30
**සහභාගීත්වය** :

| | | |
|---|---|---|
| ඩී. වී. සුනිල් මයා | - | ලේකම් |
| ඩී. ඩබ්. පත්මසිරි මයා | - | ගණකාධිකාරී |
| එම්. ඩබ්. සිසිර කුමාර මයා | - | කර්මාන්ත අධිකාරී |
| එච්. එච්. ජයසේන මයා | - | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| ශාන්ති ඩී. රාමනායක මිය | - | ප්‍රධාන කළමනාකරණ සහකාර |
| කේ. සී. සී. ප්‍රනාන්දු මිය | - | අභ්‍යන්තර විගණන නිලධාරී |
| එම්. ජී. ආර්. පුෂ්පකුමාර මයා | - | ආදායම් අංශ ප්‍රධානී / සංවර්ධන සහකාර |
| මංජරී ත්‍යාගා සමරසේකර මිය | - | සංවර්ධන සහකාර |

- 01. පිළිගැනීම. - **ලේකම්**
-
- **කාර්ය සාධන මෙවලමට අනුව ස්වයං ඇගයීම පිළිබඳව සාකච්ඡා කිරීම. - ලේකම්**

❖ 2011 කාර්ය සාධන තරගය සඳහා විනිශ්චයට පැමිණීමට පෙර ස්වයං ඇගයීමක් කළ යුතු බවත් ඒ අනුව- **ලේකම්**
කාර්ය සාධන මෙවලමෙහි 08 වෙනි පරිච්ඡේදය පරිදි ස්වයං ඇගයීම කිරීම සඳහා කමිටුවක් පත් කළ යුතු බවත් එම

කමිටුවට අංශ ප්‍රධානීන් පත් කරන බවත් 2013ග03ග08 වන දින පෙ.ව. 10ග30 ට නැවත අංශ ප්‍රධානීන් රැස් විය යුතු බවත් උපරිම ලකුණු ලබා ගැනීමට අප උත්සාහ කළ යුතු බවත් පවසා සිටින ලදී.

➢ **කාර්ය සාධන මෙවලමට අනුව ස්වයං ඇගයීම කිරීම සඳහා අංශ ප්‍රධානීන් 2013.03.08 වන දින පෙ.ව. 10.30 ට රැස්වීමට තීරණය කරන ලදී.**

➢ **ප්‍රජා සංවර්ධන නිලධාරී මෙම මස ප්‍රසූත නිවාඩු යාමට නියමිත බැවින් වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරියෙකු නම් කරන ලෙස ඉල්ලා සිටි බව. - ලේකම්**

❖ අප පළාත් පාලන ආයතනයට ආසන්න පළාත් පාලන ආයතනයක ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු වැඩ ආවරණය සඳහා පත් කිරීම කළ හැකිද යන්න පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගෙන් තමා විමසූ බවත් එලෙස වෙනත් ආයතනයක නිලධාරියෙකු නම් කිරීම සිදු නොකර ඇති බව පළාත් පාලන කොමසාරිස් පවසා සිටි බව. - **ලේකම්**

❖ එසේ වෙනත් ආයතනයක නිලධාරියෙකු නම් නොකරන ලද බව. - **ප්‍රධාන කළ: සහකාර**

❖ එසේ නම් නොකරන්නේ නම් සංවර්ධන සහකාර නිලධාරියෙකු පත් කිරීමට සිදු වන බවත් මංජරී මිය කමිටු කිහිපයක් පවත්වන බැවින් පුෂ්පරාණි මහත්මිය සුදුසු බව. - **ලේකම්**

❖ පුෂ්පරාණි මහත්මිය ද මේ වන විට විෂයයක් (පරිසර හා සෞඛ්‍ය කටයුතු) කර ගෙන යන බැවින් හා එම මහත්මියගේ දැසෙහි ආබාධිත තත්වය මත මෙවැනි විෂයයක් කර ගෙන යාම දුෂ්කර විය හැකි බව. - **අභ්‍යන්තර විගණන නිලධාරී**

❖ පුෂ්පරාණි මහත්මියටපරිසර හා සෞඛ්‍ය විෂයය කර ගෙන යාමේ දී ද මහත් දුෂ්කරතාවයන්ට සමහර අවස්ථාවන් හි දී සිදු වන බැවින් ද විෂය කරුණු කිහිපයක් ඇතුළත් මෙවැනි විෂයක් භාර දීම මගින් කාර්යක්ෂමව අදාළ කාර්යය ඉටු කර ගැනීමට නොහැකියාවක් පැවතිය හැකි බැවින් ද මෙම විෂය භාර දීම සුදුසු නොවන බව. - **මහජන සෞඛ්‍ය පරීක්ෂක**

❖ පුෂ්පකුමාර මහතාට ද භාර දිය නොහැකි බවත් එබැවින් පී.ඩී.එස්.කේ. කුලතිලක මහතා තාවකාලිකව යෙදවීම සුදුසු බවත් කුලතිලක මහතා ද ස්ථාන මාරු ලැබ යාමට නියමිත බැවින් ඒ වෙනුවෙන් පැමිණෙන අනුප්‍රාප්තික නිලධාරියා යෙදවීම සුදුසු බවත් එසේ නොමැති නම් වෙනත් විකල්පයක් තිබේද යන්නත් විමසා සිටින ලදී. - **ලේකම්**

➢ **ප්‍රජා සංවර්ධන නිලධාරී ඩී. වී. වාසනා තරංගි මිය ප්‍රසූත නිවාඩු ගිය පසු වැඩ ආවරණය කිරීම සඳහා පී.ඩී.එස්.කේ. කුලතිලක මහතා තාවකාලිකව යෙදවීමටත් කුලතිලක මහතා ද ස්ථාන මාරු ලැබ යාමට නියමිත බැවින් ඒ වෙනුවෙන් පැමිණෙන අනුප්‍රාප්තික නිලධාරියා යෙදවීම සුදුසු බවත් තීරණය කරන ලදී.**

❖ නගර සභාවේ අංක 53 - 0529 දරණ කැබ් රථය සඳහා ආදේශක රියදුරු තිලකසිරි රණසිංහ මයා යෙදවීමට ගරු සභාපතිතුමා හා ගරු උපසභාපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති බැවින් ත්‍රීරෝද රථය සඳහා යෙදවීමට සුදුසු තැනැත්තෙකු නම් කරන ලෙස. - **ලේකම්**

❖ ඉහත කැබ් රථයට කවුරුන් හෝ නම් කර පත් කරන ලෙස ගරු සභාපතිතුමා උපදෙස් ලබා දී ඇත්නම් ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව. - **වැඩ අධිකාරී**

❖ තිලකසිරි මයා නිලධාරීන්ට ගරු කිරීමක් නොකරන බවත් ඔහු පිළිබඳව කිසිදු නිලධාරියෙකු තුළ පැහැදීමක් නොමැති බවත් පෙන්වා දෙන ලදී. - **ප්‍රධාන කළ: සහකාර**

❖ නගර සභාවේ වාහන තිබූ පමණටම රියදුරන් නොමැති බව. - **වැඩ අධිකාරී**

❖ ත්‍රීරෝද රථය සඳහා ආදේශක කංකානි තනතුරෙහි සේවය කරන කේ. ඩබ්. ඉරෝෂ් රංජිත් මයා යෙදවීම සුදුසු බව හා වෙනත් විකල්ප යෝජනා තිබේ ද යන්න. - **ලේකම්**

❖ ඉරෝෂ් රංජිත් මයා ත්‍රීරෝද රථය සඳහා යොදවන්නේ නම් ලිඛිතව අනුයුක්ත කළ යුතු බවත් මෙසේ අනුයුක්ත කිරීමේ දී ත්‍රීරෝද රථය හා කැබ් රථය යන දෙකෙහිම ගැටලු මතු නොවන ආකාරයට වැඩ බෙදීමක් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. - **වැඩ අධිකාරී**

❖ සංවර්ධන හා සැළසුම් අංශයටම වාහනයක් වෙන් කර ගැනීම සුදුසු බව. - **ප්‍රධාන කළ: සහකාර**

❖ එසේ නම් ත්‍රීරෝද රථය සංවර්ධන හා සැළසුම් අංශයට හා සෞඛ්‍ය අංශයට යෙදවීම සුදුසු බව. සෞඛ්‍ය අංශයේ ද සමහර වැඩපරිපාලකවරු සම්බන්ධයෙන් සානුකම්පිතව බැලිය යුතු බවත් ඔවුන්ට ද ගමන් කිරීම සඳහා රථයක අවශ්‍යතාවය ඇති වන බවත් එබැවින් මෙම අංශ දෙකටම ත්‍රීරෝද රථය අනුයුක්ත කිරීම සුදුසු බව. - **වැඩ අධිකාරී**

❖ කැබ් රථය හා තිලකසිරි මයා මූල්‍ය කළමනාකරණය (ආදායම්) අංශයට අනුයුක්ත කිරීමටත් ත්‍රීරෝද රථය හා ඉරෝෂ් රංජිත මයා සංවර්ධන සැළසුම් අංශයේ, සෞඛ්‍ය අංශයේ රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කිරීමටත් එම රථ වල අධීක්ෂණ කටයුතු අදාළ අංශ ප්‍රධානීන් විසින් කළ යුතු බවත් පවසා සිටින ලදී. - **ප්‍රධාන කළ: සහකාර** - **ආදායම් අංශ ප්‍රධානී**

❖ කැබ් රථය හා ත්‍රීරෝද රථය සඳහා ලේඛනයක් නඩත්තු කළ යුතු බවත් එහි අධීක්ෂණය හා වගකීමද අංශ - **ප්‍රධාන කළ: සහකාර**

ප්‍රධානීන් විසින් ගත යුතු බවත් රථ ගමනාගමනය සඳහා භාවිත කිරීමට පෙර අදාළ අංශ ප්‍රධානීන්ගේ අනුමැතිය මත ලේඛනයේ සඳහන් කර යා යුතු බවත් එවිට යම් වගකීමක් ඇති වන බවත් පෙන්වා දෙන ලදී. එමෙන්ම තමා ආදායම් අංශයේ අංශ ප්‍රධානී ලෙස කටයුතු කළ කාලයේ දී ත්‍රීරෝද රථයේ යතුරු ද තමා සතුව තිබු බව.

❖ අදාළ අංශ ප්‍රධානීන් කැබ් රථයේ හා ත්‍රීරෝද රථයේ තෙල්වලට වගකිව යුතු බව හා ලේඛනයක් නඩත්තු **- ලේකම්**
කළ විට වාහනය තිබෙනුයේ කුමන ස්ථානයක ද යන්න පිළිබඳව නිවැරදිව දැන ගත හැකි බව.

➢ **ත්‍රීරෝද රථය හා ඉරෝෂ් රංජිත් මහතා සංවර්ධන සැළසුම්, සෞඛ්‍ය අංශය සඳහා අනුයුක්ත කර යෙදවීමටත් අංක 53 - 0529 දරණ කැබ් රථය හා තිලකසිරි මහතා ආදායම් අංශයට අනුයුක්ත කිරීමටත් කමිටුව තීරණය කරන ලදී.**

➢ **නගර සභා නිල වෙබ් අඩවිය සකස් කිරීම සඳහා එක් එක් අංශයෙන් ඇතුළත් විය යුතු - ලේකම්**
**කරුණු පිළිබඳව තොරතුරු මාර්තු මස 15 වෙනි දිනට පෙර ඉල්ලා සිටින ලද ලිපිය ඉදිරිපත් කිරීම.**

❖ නිල වෙබ් අඩවියට ඇතුළත් විය යුතු කරුණු සම්බන්ධව එක් ආකෘතියක් සකස් කර දෙන ලෙස. - **අංශ ප්‍රධානීන්**

❖ එක් එක් අංශයෙන් ක්‍රියාකාරී සැළැස්ම සකස් කර ලබාදිය යුතු බවත් ඒවායේ අඩුපාඩු තිබිය හැකි බවත් - **ලේකම්**
ඒවා නිවැරදි කර ගත හැකි බවත් ලබන මස මාසික සභාවට ඉදිරිපත් කිරීම සඳහා ලබා දෙන ලෙසත් අංශ ප්‍රධානීන් ගෙන් ඉල්ලා සිටින ලදී.

❖ **සංවර්ධන හා සැළසුම් අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

❖ මාසික සභාවේ දී සාකච්ඡා කරනු ලබන යම් යම් දේ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම පමණක් කරන **- වැඩ අධිකාරී**
නමුත් භෞතිකව ක්‍රියාත්මක වීමක් දැකිය නොහැකි බවත් සංවර්ධන හා සැළසුම් අංශය යනු සේවකයක් ඉතා සුළු පිරිසක් පමණක් සිටින අංශයක් බවත් එම සේවක පිරිසෙන් සියලු වැඩ කළ නොහැකි බවත් පෙර අවුරුදු වල නම් බොහෝ කර්මාන්ත ටෙන්ඩර් කර ලබා දී සිදු කරවන බවත් මේ වන විට එවැනි ක්‍රියාදාමයක් නගර සභාවේ සිදු නොවන බවත් අප විසින් මාර්ග සකස් කිරීමේදී ප්‍රමුඛතාවය ලබා දී සිදු කරන නමුත් ඉතිරි කර්මාන්ත ද ඒ අනුව ඉටු කළ යුතු බවත් නගර සභාවේ මුල්‍යමය තත්වයද මේ සඳහා බලපාන බවත් වැඩසටහන් සකස් කිරීම පමණක් නොව ප්‍රායෝගිකව ඉටු කල යුතු බවත් පෙන්වා දෙන ලදී.

❖ **මූල්‍ය කළමනාකරණය (ආදායම්) අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

❖ ධර්මාශෝක විද්‍යාලයේ පැවැත් වූ නර්තන ප්‍රසංගයක් වෙනුවෙන් විනෝද බදු අය කළ හැකිව තිබු බවත් - **වැඩ අධිකාරී**
එම ප්‍රසංගයෙන් විනෝද බදු අය කළේ ද යන්නත් විමසන ලදී. විශාල දැන්වීම් පුවරු පවා සවි කර ප්‍රචාරණය ලබා **මහජන සෞඛ්‍ය පරීක්ෂක**
දී තිබු බවත් එම ප්‍රසංගයේ ටිකට්පත් පවා විශාල මුදලකට විකුණා ඇති බවත් එමෙන්ම නගරසභා සීමාවේ පවතින ප්‍රසංග ආදිය සඳහා විනෝද බදු අය කිරීම ආදායම් පරිපාලකවරුන්ගේ වගකීම බවත් නගර සභවේ අනුමැතිය හා මුද්‍රාව නොමැතිව ටිකට්පත් පවා විකිණීමට නොහැකි බවත් ශ්‍රවණාගාර පවතින පාසල්වල ශ්‍රවණාගාර වෙන් කරන විටම විනෝද බදු අය කිරීම සඳහා නගර සභාව දැනුවත් කළ යුතු බවට පාසල් ලිඛිතව දැනුවත් කළ යුතු බවත් පවසා සිටින ලදී.

❖ එවිට නගර සභාව විසින් විනෝද බදු අය කිරීමට කටයුතු කළ යුතු බව. **- ලේකම්**

❖ ආදායම් පරිපාලකවරුන්ට මේ පිළිබඳව වැඩිපුර අවධානයෙන් සිටින ලෙසට උපදෙස් ලබා දීම සුදුසු **- ආදායම් අංශ ප්‍රධානී**
බව.

❖ 2013ග03ග01 දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය සමඟ පැවති සාකච්ඡාවේ දී වසර 05ට වරක් **- ලේකම්**
දේපලතක්සේරු කළයුතු බවත් එසේ වසර 05ට වඩා වැඩි දේපල නැවත තක්සේරු කිරීමේ දී කිසියම් ප්‍රමාදයක් **- ප්‍රධාන කළ:සහකාර**
සිදු වන්නේ නම් සඳහා පළාත් පාලන සහකාර කොමසාසාරිස් හරහා ඉල්ලීමක් කරන ලෙසත් ඉන්පසු පළාත් පාලන සහකාර කොමසාරිස් දේශීය ආදායම් වෙතින් ඉල්ලීමක් කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බවත් තවද අප විසින් දේපල තහනම් කිරීමේ නිලධාරියෙකු ලබා දෙන ලෙස දේශීය ආදායම් වෙත ඉල්ලීමක් කරන්නේ නම් එම නිලධාරියා ද දේශීය ආදායම් විසින් ලබා දෙන බවත් ඒ වෙනුවෙන් වු කොමිස් මුදල දේශීය ආදායම් එකට ලබා දිය යුතු බවත් පෙන්වා දෙන ලද බව.

❖ මෙම කරුණු දෙක පිළිබඳව ඉල්ලීමක් කර ලිපියක් යවන බව. **- ආදායම් අංශ ප්‍රධානී**

❖ දේපල තහනම් කිරීමේ කටයුතු පිළිබඳව තත්වය කෙසේද යන්න. **- ලේකම්**

❖ දේපල තනම් කිරීම සඳහා අවසන් දැනුම් දීමේ කටයුතු සිදු කර ඇති බවත් ඒ අයට ලබා දී ඇති කාල **- ආදායම් අංශ ප්‍රධානී**

සීමාව ද අවසන් වී ඇති බවත් පවසා සිටින ලදී.

❖ දේපල තහනම් කිරීමේ නියෝග ප්‍රමාද වන විට ආයතනය, නිලධාරීන් හා ගරු සභාපතිතුමා අපහසතා - **ලේකම්**
වයන්ට පත් නොවිය යුතු බවත් අප විසින් නීතිය පෙන්වා දිය යුතු බවත් පවසා සිටින ලදී.

❖ **මූල්‍ය කළමනාකරණය (ගිණුම්) අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

❖ අවසාන ගිණුම සකස් කිරීම පිළිබඳ කටයුතු කෙසේද යන්න. - **ලේකම්**

❖ 2013ග03ග08 වන සිකුරාදා දිනවන විට අවසන් ගිණුම සකස් කිරීමේ කටයුතු සියලු ගැලපීම් කර අවසන් - **ගණකාධිකාරී**
කළ හැකි බවත් ලබන සතිය වන විට නගර සභා පනතේ විධි විධාන යටතේ ගරු සභාපතිතුමාගේ සහ තවත් එක්
ගරු නගර සභා මන්ත්‍රීවරයෙකුගේ අත්සන යොදා සහතික කර මුද්‍රණය කිරීමට අවස්ථාව තිබෙන බවත් මේ මස
25 වන දින වන විට තැපෑලට යොමු කළ හැකි බවත් පෙන්වා දෙන ලදී.

❖ සුළු සුළු වෙනස්කම් කිහිපයක් පමණක් ගැලපීමට ඇති බව විෂය භාර නිලධාරී පැවසූ බව. - **අභ්‍යන්තර විගණන නිලධාරී**

❖ **පරිපාලන අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ කිසියම් නිලධාරියෙකුගේ හෝ සේවකයෙකුගේ හැසිරීම, පැමිණීම, වැඩ හොඳය යන්න කාර්ය සාධනය - **ප්‍රධාන කළ: සහකාර**
යන්නෙන් අදහස් නොවන බවත් ඒ අයට පවරා දී ඇති රාජකාරී වගකීම නිසියාකාරව සිදු කර තිබේද යන්න ඉන්
අදහස් වන බවත් මේ පිලිබඳව පළාත් පාලන කොමසාරිස් විසින් ද පැවසූ බවත් එමෙන්ම එක් එක් අංශයේ අංශ
ප්‍රධානීන් විසින් අංශයේ නිලධාරීන්ගේ, සේවකයන්ගේ රාජකාරී ලැයිස්තු සකස් කර දෙන ලෙසත් පවසා සිටින ලදී.

❖ එක් එක් ආයතනවලින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අන්තර්ජාලය මගින් සතියකට වරක් ලබා ගෙන - **ලේකම්**
අදාළ අංශ ප්‍රධානීන්ට ලබා දෙන ලෙසත් එලෙස ලබා ගන්නා චක්‍රලේඛ පිළිබඳ විස්තර ලේඛනයක සටහන් කරන - **ප්‍රධාන කළ: සහකාර**
ලෙසත් පරිගණක දත්ත ක්‍රියාකරු වෙත ලිඛිතව දැනුම් දී ඇතත් එය මෙතෙක් සිදු නොවූ බව.

❖ සභා වාර්තාව, න්‍යාය පත්‍රය හා අනෙකුත් ඇමුණුම් අනිවාර්යයෙන්ම ලේඛනයක අලවා යාවත්කාලීනව - **ලේකම්**
පවත්වා ගෙන යන ලෙස විෂය ලිපිකරුට හා අදාළ කාර්යාල කාර්ය සහායකට දන්වන ලෙසත් එහි අධීක්ෂණය - **වැඩ අධිකාරී**
ප්‍රධාන කළමනාකරණ සහකාර විසින් කළ යුතු බවත් පවසා සිටින ලදී.

❖ එමෙන්ම සභා වාර්තාවේ පිටපත් ලිඛිතව ලේඛනාගාරයේ ද තිබිය යුතු බවත් සභා වාර්තා සංරක්ෂණය - ලේකම්
කිරීම සඳහා පරිඝණකයේ ආරක්ෂිතව තැන්පත් කර තැබිය හැකි බවත් එසේම සීඩී තැටියක හෝ පැබ ඝරසඩෑ එකක
තැන්පත් කර තැබිය හැකි බවත් පෙන්වා දෙන ලදී.

❖ **සෞඛ්‍ය අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

❖ සෞඛ්‍ය අංශයේ හා සංවර්ධන සැළසුම් අංශයේ සේවකයන්,උපපරිපාලකවරුන් හා අධීක්ෂණ නිලධාරීන්- **වැඩ අධිකාරී**
පිළිබඳව සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ කිසිඳු පැහැදීමක් නොමැති බව මෙවර පැවති මාසික සභාවේ දී වඩාත් - **ප්‍රධාන කළ: සහකාර**
තහවුරු වූ බැවින් සියලුම දෙන පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා සාකච්ඡා කර දිනක් හෝ දෙදිනක් යාමට කටයුතු
සකස් කර ගත යුතු බව.

❖ එක් උපපරිපාලකවරයෙකු සඳහා දිනකට පරීක්ෂා කළ යුතු කොට්ඨාස කිහිපයක් ලබා දී ඇති බවත් - **මහජන සෞඛ්‍ය පරීක්ෂක**
අප පරීක්ෂා කරන අවස්ථාවක දී ඉන් එක් කොට්ඨාසයක අදාළ උපපරිපාලකවරයා සිටිය යුතු බව.

❖ සෞඛ්‍ය කම්කරුවන් (කාන්තා) ප්‍රධාන මාර්ගවලට පමණක් යෙදවීම සුදුසු බව. - **අභ්‍යන්තර විගණන නිලධාරී**

❖ උපපරිපාලකවරුන් පරිහරණය සඳහා ඇති කාමරය උදේ 6ග00 සිට සවස 2ග00 වනතුරු වසා තැබීමට - **ලේකම්**
ත් එහි වගකීම මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ගත යුතු බවත් එම කාමරයේ දොරෙහි ඉබි යතුරු දැමීමද යතුරු - **ප්‍රධාන කළ:සහකාර**
මහජන සෞඛ්‍ය පරීක්ෂක භාරයේ තබා ගත යුතු බවද වැඩිදුරටත් පවසා සිටින ලදී.

❖ ගලිබවුසරයේ සේවාව සඳහා නගර සභාව විසින් ලබා ගන්නා මුදල සංශෝධනය විය යුතු බව. - **ලේකම්**

❖ ගලිබවුසරය සඳහා ලබා ගන්නා මුදල සංශෝධනය කිරීම පිළිබඳව ගරු සභාපතිතුමා සමඟ ද සාකච්ඡා- **මහජන සෞඛ්‍ය පරීක්ෂක**
කළ යුතු බවත් ට්‍රැක්ටර් රථ බොහෝ වේලාවක් පණ ගන්වා තිබීමට සිදු වී ඇති බවත් ඕල්ඩිනේටර් මීටර් නොමැති
වීම හේතුවෙන් එසේ කිරීමට සිදු වී ඇති බවත් ඒ නිසා තෙල් පිච්චීම වැඩි පුර සිදු වන බවත් බැටරියට ද හානි වන
බවත් පෙන්වා දෙන ලදී.

❖ අත්‍යාවශ්‍ය භාණ්ඩ ඉල්ලා සිටින ලෙස. - **ලේකම්**

❖ අත්‍යාවශ්‍ය බඩු ඉල්ලා ඇති බව හා මුලින්ම ඕල්ඩිනේටර් මීටර් ඉල්ලා ඇති බවත් තවම නොලැබුණ බව. - **මහජන සෞඛ්‍ය පරීක්ෂක**

❖ සැපයුම් නිලධාරී කමිටුවට කැඳවා අවශ්‍ය භාණ්ඩ ලබා දෙන ලෙස පවසා සිටින ලදී.

❖ අදාළ ආයතනයෙන්ම මිළ ගණන් ගෙන්වා ඇති නමුත් භාණ්ඩ එම ආයතනයෙන් නිකුත් කරනුයේ මාර්තු - **සැපයුම් නිලධාරී**
මස මැද පමණ වන විට බවත් (එම ආයතනයේ භාණ්ඩ සමීක්ෂණ හේතුවෙන්) එවිට භාණ්ඩ ගෙන්වා දිය හැකි

බවත් පවසා සිටින ලදී

❖ අතිකාල වැඩ කිරීම හේතුවෙන් සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා විශේෂ දීමනාවක් ගෙවීම පිළිබඳව **- මහජන සෞඛ්‍ය පරීක්ෂක**
තීරණය කරන ලෙස. ඔවුන් අමතර රාජකාරියක් සම්බන්ධව ගෙවීමක් කිරීම ගැටලුවක් විය නොහැකි බව.

➢ **අතිකාල වැඩ කිරීම හේතුවෙන් සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා විශේෂ දීමනාවක් ගෙවීම සුදුසු බවට කමිටුව තීරණය කරන ලදී.**

02. රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.

❖ ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. **- ප්‍රධාන කළමනාකරණ සහකාර**

**2013- 03- 05** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013-03- 05 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 2** **2013- 03- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව සභාගත කරන ලදී.

01. ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා සභාපති
02. ශාන්ති ඩී. රාමනායක මිය ප්‍රධාන කළමණාකරණ සහකාර
03. පී.ඩී.එස්.කේ. කුලතිලක මහතා සංවර්ධන සහකාර
04. කේ.ඩබ්. රංජනී මානෙල් මෙනවිය පුස්තකාලයාධිපති
05. හර්බට් වීරක්කොඩි මහතා කමිටු සාමාජික
06. සුගත් හෙට්ටිආරච්චි මහතා කමිටු සාමාජික
07. එන්.එච්. ඩන්කන් ද සිල්වා මහත කමිටු සාමාජික
08. බී.එච්. විමලදාස මහතා කමිටු සාමාජික
09. සිරිපාල මාදුවගේ මහතා කමිටු සාමාජික
10. ජී.ඩබ්. ගුණසිරි මහතා කමිටු සාමාජික
11. ටී.ඩබ්. පියසිරි මහතා කමිටු සාමාජික
12. ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා කමිටු සාමාජික
13. ගෞරී වරුසවිතාන මිය පුස්තකාල සහයිකා
14. වී.ජී. ලක්ෂ්මි කාන්තා පෙරේරා මෙනවිය පුස්තකාල සහයිකා
15. එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය පුස්තකාල සහයිකා
16. වී.ජී. රසිකා මිය පුස්තකාල සහයිකා
17. ජී.එච්.එල්. ප්‍රියන්ති මෙනවිය පුස්තකාල සහයිකා
18. මාලනී සමන්තා අරියසිංහ මිය පුස්තකාල සහයිකා

19. කේ.ඒ. විසුද්ධි රේණුකා මිය පුස්තකාල සහයිකා

20. ඇම්. නන්දනී පුෂ්පරානි මිය පුස්තකාල සහයිකා

21. ඩී.එම්.පී.එස්. දිල්රුක්ෂි මිය ආ/ පුස්තකාල සහයිකා

මුලාසනය

ගරු සභාපතිතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම කමිටු සාමාජික මහතුන් ප්‍රධාන කළමණාකරන සහකාර මිය සංවර්ධන සහකාර පී.ඩී.එස්.කේ. කුලතිලක මහතා ඇතුලු පුස්තකාල කාර්යමණ්ඩලය පිළිගැනීමෙන් කමිටුවේ වැඩ ආරම්භ කරන ලදී.

01. පුස්තකාල ප්‍රගති වාර්තාව කමිටුවට ඉදිරිපත් කිරීම.

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපති කේ.ඩබ්. රංජනී මානෙල් මෙනවිය විසින් ද අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලදී පොල්වත්ත ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජී.එච්.එල්. පියන්ති මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදි.

ඉන්පසුව ගරු සභාපතිතුමා, පෝරඹ ශාඛා පුස්තකාලයේ සේවය කරන ලක්ෂ්මි පෙරේරා මෙනවියගෙන් විමසා සිටියේ එම ශාඛා පුස්තකාලයේ පාඨක සංඛ්‍යාව අඩුවීම හා බැහැරදෙන අංශයේ පොත් නිකුත් කිරීම තුන්වන ස්ථානයට පත්ව ඇති බවයි. එහිදී එම නිලධාරිනිය කියා සිටියේ ඇය භාරගන්නා අවස්ථාවේ සාමාජිකයන් නොසිටි බවත්, සාමාජිකයන් 35 ක් ඇය බඳවා ගත් අය බවයි.

**තීරණය**

1. ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ දියුණු කිරීමට බලාපොරොත්තුවන පුස්තකාලයක් ලෙස පෝරඹ නම් කර තිබුණත් ඉදිරියේදී එම තීරණය වෙනස් කිරීමට සිදුවන බවයි. පොත් විශාල සංඛ්‍යාවක් තිබුණත් බැහැර දීම අඩු මට්ටමක පවතී නම් එම ස්ථානය පොත් බැහැරදීම ඉහල මට්ටමක පවතින පුස්තකාලයකට ලබා දීමට සිදුවන බවත්ය.

2. ඉන් පසුව ගරු සභාපතිතුමා පුස්තකාලාධිපතිගෙන් අදහස් විමසා සිටියේ ගෙන එන ලද පොත් පාඨකයන්ට ලැබීමට සැලැස්වූවද යන්නයි. එහිදී පුස්තකාලයාධිපති කියා සිටියේ පොත් බැඳීමට අවශ්‍ය ද්‍රව්‍ය නොමැති බවත්, අපට ලබා දෙන රු. 5000/- අත්තිකාරම් වලින් එම බඩු ලබා දුන් බවත් ය.

03. පොත් සංරකෂණය කිරීමට ගත් ක්‍රියාමාර්ග වෙනුවෙන් පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයෙන් එවන ලද ලේඛනය ගරු සභාපතිතුමා කමිටුවට ඉදිරිපත් කරන ලදී. සංරක්ෂණ ක්‍රියා මාර්ග ගැනීමේදී අප පුස්තකාලය තේරී ඇති බව ලිපියෙන් දන්වා සිටින ලදී.

3.1 ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිගෙන් අදහස් විමසා සිටියේ එම තේරීම සඳහා පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය අපට ලබා දෙන්නේ මොනවාද යන්නයි.

3.2 පුස්තකාලයාධිපති කියා සිටියේ සහතිකය ලබා දෙන අතර ඉදිරියේදී අවශ්‍ය උපදෙස් ආදිය ලබා ගත හැකිය යන්නයි.

04. ජිනේන්ද්‍රවංශ මහතා කතා කරමින් කියා සිටියේ සම්පූර්ණ පොත් එකතුව 31000 ක් වුවත් ඉන් 14000 ක් පමණ ශාඛා පුස්තකාලවල බවත් ප්‍රධාන පුස්තකාලයේ පොත් 17000 ක් පමණ ප්‍රමාණයක් අති බවත්ය. එහිදී ජිනේන්ද්‍රවංශ මහතා පෙන්වා දුන්නේ තමා 1961 පොත් ගැනීමේදී ලබා ගත් කාඩ් ක්‍රමයම අදටත් දක්නට ලැබෙන බවත් දියුණුවන ලෝකයේ අද පරිගණක තාක්ෂණයත් සමඟ අපද එයට අනුගත විය යුතු බවයි. පුස්තකාල පොත් පරිගණකගත කිරීම තුලින් පහසුවක් ලැබීම ගැන එතුමා අදහස් දක්වා සිටින ලදී.

4.1 සිරිපාල මාදුවගේ මහතා කතා කරමින් කියා සිටියේ පුස්තකාල තේරීමේ තරඟාවලියේදී හොඳම මහජන පුස්තකාලය තේරීමේ තරඟාවලියේ පුස්තකාල පරිගණක ගත කිරීම සඳහා ලකුණු 50 ක් ලැබෙන බවත් එම ලකුණු අපට පහසුවෙන් ලබා ගත හැකි බවත්ය.

**තීරණය - 02**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ මෙම වර්ෂයේ පුස්තකාල පරිගණක ගත කිරීම හා පරිගණක අංශයක් ඇති කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවත්ය. ඒ ගැන දන්නා ධර්මාශෝක විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු වන විසිත ලීලාරත්න මහතා එතුමාට කොට්ටාව ප්‍රාදේශීය සභාව කරන වැඩසටහනකදී හමුවූ බවත් අද දින එතුමාට කමිටුවට පැමිණ අදහස් ලබා දෙන ලෙස ආරාධනා කළ බවත් ය.

4.2 ගරු සභාපතිතුමා සැපයුම් නිලධාරිනියට කමිටුවට එන ලෙස දන්වන ලදී. එහිදී එම නිලධාරිනිය පරිගණකය ගෙන ඒමට ගොස් ඇති බව සංවර්ධණ සහකාර පී.ඩී.එස්.කේ. කුලතිලක මහතා කමිටුවට දන්වන ලදී.

05. ගරු සභාපතිතුමා පාඨක අදහස් ලේඛණ පරීක්ෂා කිරීමෙන් පසුව කියා සිටියේ නවකතා පොත් ලබා දීම පිළිබඳ ස්තුති කර ඇති බවයි. එතුමා කියා සිටියේ ඉල්ලන්නේ කතාපොත් නම් අපි ඒ ඉල්ලීමත් ඉටු කර දිය යුතු බවයි.

5.1. පෝරඹ ශාඛා පුස්තකාලයෙන් මාස්ටර් ගයිඩ් පොත් ලබා දෙන ලෙස ඉල්ලා ඇති බවත් ඒවා ලබා දුන්නාද යන්න ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිගෙන් අදහස් විමසා සිටින ලදී. එම ඉල්ලීමට පොත් ගෙනවිත් දුන් බවත් ප්‍රධාන පුස්තකාලයටත් එම මාස්ටර්ගයිඩ් පොත් කට්ටල ලබා ගත් බව ප්‍රකාශ කරන ලදී. එහිදී ගරු සභාපතිතුමා කියා සිටියේ අලුත් විෂය

නිර්දේශවලට අවශ්‍ය පොත් නොමැති බවට පාඨකයින් එතුමාට සහ බිරිඳට ද දැනුම් දී ඇති බවත් ය.

**තීරණය - 03**

ඉදිරියේදී පොත් ගෙන ඒමේදී විදුහල්පතිවරු මගින් අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමෙන් හා දක්ෂ දරුවන්ගෙන් අවශ්‍ය පොත් ලැයිස්තු ලබාගෙන ඒවාට ප්‍රමුඛත්වය ලබා දී පොත් ගෙන එන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

5.2 ජිනේන්ද්‍රවංශ මහතා අදහස් දක්වමින් කියා සිටියේ මෙවර ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය දිනයේදී වැඩිම අලෙවිය කර ඇත්තේ මාස්ටර් ගයිඩ් පොත්, පොත් ප්‍රකාශකයෝ බවයි. එම පොත්වලට අද විශාල ඉල්ලුමක් ඇති බවය.

06. ප්‍රධාන පුස්තකාලයේ සේවය කර පුස්තකාලයාධිපති ලෙස පත්වීම් ලද කේ.ඩබ්. රංජනී මානෙල් මෙනවිය සහ 2013.04.01 දින සිට පුස්තකාලයාධිපති ලෙස පත්වීම් ලබා යන ඇම්. නන්දනී පුෂ්පරානි මිය විසින් කමිටුවේ සියලු දෙනාට තේ පැන් සංග්‍රහයක් ලබා දෙන ලදී. එහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ ආයතනය වෙනුවෙන් විශාල සේවයක් කළ එතුමිය යෑම පාඩුවක් බව නමුත් එහිදී ඇයගේ අනාගතයට සුභ ප්‍රාර්ථනා කරන ලදී. කමිටුවේ සියලු දෙනාම ඇයගේ සේවය අගය කළ අතර, ඉදිරි අනාගතයට සුභ ප්‍රාර්ථනා කරන ලදී.

07. ගරු සභාපතිතුමාගේ ආරාධනයෙන් මෙම කමිටුවට පැමිණි විසිත ලීලාරත්න මහතා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. එහිදී ගරු සභාපතිතුමා අපගේ නගර සභාවේ මාසික සභාව ඉදිරියේදී ගෙදරදීම නැරඹීමට හැකි වන පරිදී අන්තර් ජාලයට එකතු කිරීමට බලාපොරොත්තු වන බවත් පුස්තකාල දෛනික කටයුතු පරිගණකගත කර අන්තර් ජාලයට එකතු කිරීමට බලාපොරොත්තු වන බවත් එම ක්‍රියාවලිය සඳහා විසිත ලීලාරත්න මහතාගේ දැනුම ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

7.1 විසිත ලීලාරත්න මහතා අදහස් ලාබ දෙමින් කියා සිටියේ පළමු ශ්‍රේණියේ, දෙවැනි ශ්‍රේණිය වැනි කුඩා ළමුන් සඳහා වෙනම පොත් ගොනුවක් පවත්වාගෙන යන ලෙසත් නැතිනම් කුඩා ළමුන් සියලුම පොත් ඇල්ලීමෙන් පොත්වලට ද හානියක් සිදුවන බවයි. එතුමාගේ අදහස වූයේ පුස්තකාලය සඳහා පරිගණක ජාලයක් ආරම්භ කිරීම පළමුව ශාඛා පුස්තකාලයකින් ආරම්භ කරමුද යන්නයි. එහිදී කමිටු සාමාජික මහතුන් සියලුදෙනාම සහ කාර්ය මණ්ඩලය පෙන්වා දුන්නේ ප්‍රධාන පුස්තකාලයෙන් එම කටයුත්ත ආරම්භ කරන ලෙසයි. පුස්තකාල පරිගණක ගත කිරීමෙන් විශාල ගමනක් යා හැකි බවත් එය අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් ආරම්භ කිරීමට තමා කැමති බවත් පෙන්වා දෙන ලදී.

7.2 විසිත ලීලාරත්න මහතා විසින් "කුරුලු කැදැල්ල" නම් ග්‍රන්ථයේ පිටපත් සියයක් පුස්තකාලයට පරිත්‍යාග කරන ලදී. ගරු සභාපතිතුමා එම පරිත්‍යාගය වෙනුවෙන් එතුමාටම ස්තූතිය ප්‍රකාශ කරන ලදී.

7.3 විසිත ලීලාරත්න මහතා අදහස් දක්වමින් කියා සිටියේ පුස්තකාල පොත් පරිගණක ගත කිරීම තුලින් සියලුම ශාඛා එකට එකතකු කර ජාලයක් ලෙස පවත්වාගෙන යා හැකි බවත් කුමන ශාඛාවක සාමාජිකත්වය දැරුවත් ඕනෑම ශාඛාවක පොත් ලබා ගැනීමට පහසුකම් මේ තුලින් ඇති කළ හැකි බවත්, හොඳ ආරක්ෂිත වැඩපිළිවෙලක් ඒ සඳහා අවශ්‍ය බවත්ය.

7.4 ගරු සභාපතිතුමාට අරලියගහ මන්දිරයේ රැස්වීමට යාමට අවශ්‍ය බව දැනුම් දී විසිත ලීලාරත්න මහතා ආරාධනය පිළිගෙන පැමිණීම ගැන ස්තූතිය ප්‍රකාශ කරමින් සමුගෙන යෑමට සිදු වීම ගැන කණගාටුව ප්‍රකාශ කරමින් ඉදිරි කමිටු වැඩ කරගෙන යන ලෙස උපදෙස් දෙමින් පරිගණක ගත කිරීම් කටයුතුවලදී සියලු සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් එතුමා නික්ම ගියේය.

7.5 ජිනේන්ද්‍රවංශ මහතා පෙන්වා දුන්නේ අප පළමුව ප්‍රධාන පුස්තකාලයෙන් ළමා අංශයේ හෝ පටන් ගෙන පියවරෙන් පියවර ඉදිරියට යමු යන්නයි. අම්බලන්ගොඩ ප්‍රදේශයේ අවශ්‍යතාවන් පෙන්වා දෙමින් නවීන ලෝකය කරා යන ගමන ප්‍රධාන පුස්තකාලයෙන් ආරම්භ කරමු යන්නයි. එහිදී විසිත ලීලාරත්න මහතා 2013.03.24 වැනි දින කැනඩාව බලා පිටත් වන බවත්, එතුමාගේ පූර්ණ සහයෝගය දැනුම නගර සභාව වෙනුවෙන් ලබා දීමට පූර්ණ එකඟතාවය ප්‍රකාශ කරන ලදී. එතුමා පෙන්වා දුන්නේ අද පොත් සී.ඩී. ආදී නවීන මාධ්‍ය තුලින් තැන්පත් කිරීමෙන් පුස්තකාල වල ඉඩ පහසුකම් ලබා ගත හැකි බවත් පොත් සංරක්ෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කර ඒ තුළ තැන්පත් කිරීමෙන් අපහසුතා වලක්වා ගැනීමට ද හැකි වන බවත් අම්බලන්ගොඩ නගරයෙන් හොඳ කටයුත්තක් ආරම්භ කර ලංකාවට ද ලෝකයට ද ලබා දීමට එතුමාගෙන් පූර්ණ සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ප්‍රජා සංවර්ධන නිලධාරී වෙනුවෙන් වැ.බ. සංර්ධන සහකාර පී.ඩී.එස්.කේ. කුලතිලක මහතා ස්තූති කතාව කරන ලදී. එහිදී එතුමා උසස්වීම් ලබා සිටින නිලධාරීන් දෙදෙනාට සුභ ප්‍රාර්ථනා කරන ලදී. ඉන්පසුව සභාපතිතුමාගේ කෙටි දැනුම් දීමෙන් පුස්තකාල කමිටුවට පැමිණ හරබර දැනුවත් කිරීමේ දේශනය ලබා දුන් විසිත ලීලාරත්න මහතාට ස්තූතිය ප්‍රකාශ කරන ලදී. ස්වේච්ඡා වෙන් කමිටුවට පැමිණි සියලුම කමිටු සාමාජික මහතුන්ට හා ප්‍රධාන කළමණාකරණ සහකාර ශාන්ති සී රාමනායක මියට ද පුස්තකාලයාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදී.

**2013- 03- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013-03- 21 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 3** **2013- 03- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන ක්‍රියාකාරී කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**සහභාගීත්වය :**

| | | |
|---|---|---|
| **ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මයා** | - | **ගරු සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ** |
| **ධම්මික ද සිල්වා මයා** | - | **පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ** |
| **ලලිත් හැලඹගේ මයා** | - | **සභාපති, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ** |
| **අසිත ධනවංශ මයා** | - | **සම ලේකම්, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ** |
| **සුජීව සොයිසා මයා** | - | **භාණ්ඩාගාරික, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ** |
| **ඩී. වී. සුනිල් මයා** | - | **ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ** |
| **මංජරී ත්‍යාගා සමරසේකර මිය** | - | **සංවර්ධන සහකාර, නගර සභාව, අම්බලන්ගොඩ** |

01. පිළිගැනීම - **ගරු සභාපති, නගර සභාව**

- ❖ උත්තල දර්පණ අපගේ මුදල් වලින් සවි කර ඒ සඳහා වු බිල්පත ඉදිරිපත් කල පසු පියාපියෝ ආයතන යෙන් මුදල් ලබා දීමට නියමිත බව. ඒ සඳහා පියාපියෝ ආයතනයෙන් ලිපියක් අවශ්‍ය බව. - **ගරු සභාපති, නගර සභාව**
- ❖ එම ලිපිය ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සමන් අත්තනායක මහතා දැනුවත් කිරීම කරන බව. - **සභාපති, වෙළඳ සංගමය**
- ❖ පදික වේදිකාවේ වෙළඳාම් කරන අනවසර වෙළෙඳුන් ඉවත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් ඉදිරියේ දී උත්සවකාලය එන බැවින් මේ අවස්ථාවේ සිටම ඉවත් කිරීමේ කටයුතු කරන්නේ නම් සුදුසු බව. - **සමලේකම්**
- ❖ ඉදිරියේ දී එළඹෙන උත්සව කාලසීමාවේ සති 02 ක පමණ කාලයක් වන තුරු පදික වේදිකාවේ වෙළඳාම් කරන්නන් ඉවත් නොකළ හොත් අම්බලන්ගොඩ නගරය පසු කිරීමට විනාඩි 30 ක පමණ කාලයක් ගත වන බැවින් පදික වෙළෙඳුන් ඉවත් කරන ලෙස. - **ගරු සභාපති, නගර සභාව**
- ❖ මේ සඳහා නගර සභාවේ ද සහාය ලබා දෙන ලෙස. - **පොලිස් නිලධාරීන්**
- ❖ ගියවර උත්සව කාලයේ දී ද පොලිස්පතිතුමාගෙන් ඉල්ලීමක් කර විශේෂ පොලිස් කණ්ඩායමක් ගෙන්වා ගත් බවත් මෙවරත් අවශ්‍ය නම් එලෙස කළ හැකි බව. - **ගරු සභාපති ,නගර සභාව**
- ❖ පදික වේදිකාව ඉවත් නොකළ විට මිනිසුන්ට ගමන් කිරීමට සිදු වනුයේ පාරේ බැවින් වාහන තදබදයක් ඇති වන බවත් එමෙන්ම පිලිගත් ආයතන වලින් පැමිණ වෙළඳාම් කටයුතු සිදු කරන්නේ නම් ගැටලුවක් නොවන බවත් මෙහිදී පාරිභෝගිකයන්ගේ සුරක්ෂිත භාවය හා විශ්වාසය රැකෙන අයුරින් කටයුතු කිරීම පිළිබඳව සැළකිලි මත් විය යුතු බවත් පවසා සිටින ලදී. - **සභාපති, වෙළඳ සංගමය**
- ❖ පුද්ගලික ඉඩම් සංචාරක වෙළෙන්දන්ට ලබා දීමෙන් සිදු වනුයේ කුමක්ද යන්න පිළිබඳව. - **සමලේකම්, වෙළඳ සංගමය**
- ❖ පුද්ගලික ඉඩම් ලබා දීමෙන් එම ඉඩම් අයිතිකරුවන් විශාල මුදලක් ලබා ගන්නා බවත් නගර සභාව විසින් ඔවුන්ට තාවකාලික වෙළඳ බලපත්‍රයක් නිකුත් කරන බවත් පුද්ගලික ඉඩම් ලබා දීම නවතා දැමීමට හැකියාව ක් නොමැති බවත් පෙන්වා දෙන ලදී. - **ගරු සභාපති ,නගර සභාව**

**❖ නගර සභාව හා පොලීසිය සමග එක්ව පදික වේදිකාවේ අනවසර වෙළෙඳුන් ඉවත් කිරීම සුදුසු බවට කමිටුව තීරණය කරන ලදී.**

- ❖ ධර්මාශෝක විද්‍යාලීය සංවත්සරය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය වෙනුවෙන් විශේෂ රථවාහන සැළැස්ම ක් සකස් කර ඇති ද යන්න පොලිස් නිලධාරීන් ගෙන් විමසා සිටින ලදී. - **ගරු සභාපති ,නගර සභාව**
- ❖ සංඝරාජ පාරත්, ඇල්පිටි පාරේ එක් කොටසකත් වාහන නවතා තැබීමට තීරණය කර ඇති බව හා එසේ නොමැති නම් පොලිස් ක්‍රීඩාපිටිය භාවිත කරන ලෙස ඉල්ලා සිටි බවත් වාහනය රියදුරු සමඟ එහි නවතා තැබීමට

හැකි බවත් පෙන්වා දුන් නමුත් එම යෝජනාවට විද්‍යාලයෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු බවත් පවසා සිටින ලදී. - **පොලිස් නිලධාරීන්**

- ❖ මුහුදු වෙරළ පාර, සුසාන භූමිය වාහන නවතා තැබීමට යොදා ගත හැකි බව. - **ගරු සභාපති, නගර සභාව**

- ❖ රාත්‍රී කාලයේ දී මහා වීදීය හා දේවානන්ද විද්‍යාලය ඉදිරිපිට ද වාහන නවතා තැබීමට සුදුසු බව. **- සභාපති, වෙළඳ සංගමය**
- ❖ යතුරු පැදි ආදිය වැඩි ප්‍රමාණයක් පැමිණෙන බැවින් එවා නවතා තැබීමට වික්‍රමසූරිය පාර ද රාත්‍රී කාලයේ දී භාවිත කළ හැකි බවත් විද්‍යාලයීය ආරාධිතයන්ගේ වාහන විද්‍යාලය ඇතුළත නවතා තැබීමට සුදුසු බවත් ගාලු පාර හා ඇල්පිටිය පාර අත් හරින ලෙසත් පොලීසිය වාහන වල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම ගන්නේ නම් බෞද්ධ මධ්‍යස්ථානය ද වාහන නවතා තැබීමට සාකච්ඡා කර ලබා ගත හැකි බව. විද්‍යාලයද රථ වාහන සැළැස්මක් පිළිබඳව අප සමඟ සාකච්ඡා කළ නොමැති බවත් අවශ්‍ය නම් ඒ ඒ ස්ථානවලට අදාළව දැන්වීම් පුවරු සකස් කර දිය හැකි බවත් ඒ අනුව වාහන නවතා තැබිය හැකි බවත් වාහන සම්බන්ධව යම් කිසි ආරක්ෂිත ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. **- ගරු සභාපති, නගර සභාව**
- ❖ අනිවාර්යයෙන්ම වාහන නැවතුම් ස්ථාන ළඟ පොලීසිය යෙදවිය යුතු බවත් එසේ නොමැති වු විට වාහන සොරකම් කිරීමට ඉඩ ඇති බවත් අපි මේ පිළිබඳව සැළැස්මක් සකස් කර ඔබතුමා සමඟ සාකච්ඡා කරන බව. **- පොලිස් නිලධාරීන්**

**❖ ධර්මාශෝක විද්‍යාලයීය සංවත්සර උත්සව කාල සීමාව තුළ දී රථ වාහන නැවැත්වීම පිළිබඳව සැළැස්මක් සකස් කර නගර සභාවට ඉදිරිපත් කල යුතු බවට කමිටුව තීරණය කරන ලදී.**

- ❖ සරසවි හන්දියේ සිට පිරවුම්හල දක්වා මාර්ගයේ වාහන නැවැත්විය නොහැකි බවත් දවස් හතරක් එකම පැත්තේ වාහන නවත්වන බවත් එම නිසා එම පැත්තේ වෙළඳ ස්ථානවලට එය අවහිරයක බව. **- භාණ්ඩාගාරික, වෙළඳ සංගමය**
- ❖ අප විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථා අනුව එක් පැත්තක පමණක් වාහන නැවැත්වීමට තීරණය කර ඇති බවත් එම අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමට පොලීසිය විසින් නව රථ වාහන සැළැස්ම හඳුන්වා දුන් බවත් එහිදී අඩුපාඩු පවතින්නේ නම් පැවසිය හැකි බවත් පවසා සිටින ලදී. **- ගරු සභාපති, නගර සභාව**
- ❖ එමෙන්ම නගර සභා පාර හා පුංචි පොළ පාර පෙ.ව. 7ග00 සිට 8ග00 දක්වා සහ ප.ව. 1ග00 සිට 2ග00 දක්වා පමණක් වසා තැබීමට තීරණය කළ ද පොලීසිය විසින් මාර්ග දැන්වීම් පුවරු සකස් කිරීමේ දී වේලාවන් වෙනස් කර ඇති බවත් එම වේලාවන් සංශෝධනය විය යුතු බවත් පෙන්වා දෙන ලදී. **- ගරු සභාපති, නගර සභාව**
- ❖ අදාළ වේලාවන් සංශෝධනය කර නැවත මාර්ග පුවරු සකස් කරන ලෙසත් ඒ අනුව පොලිස් නිලධාරීන් දැනුවත් කරන බව. **- පොලිස් නිලධාරීන්**
- ❖ හල්වතුර මංසන්ධියේ ඇති ත්‍රිකෝණාකාර වටරවුම සම්බන්ධ ව තත්වය කෙසේද යන්න. **- සභාපති, වෙළඳ සංගමය**
- ❖ අප විසින් ඉල්ලීමක් කළ බව හා ඒ පිළිබඳව පිළිතුරක් තවම නොලැබුණු බව. **- ගරු සභාපති, නගර සභාව**

**➢ මෙම කමිටු රැස්වීම වෙළඳ සංගමයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත ලබන මස (අප්‍රේල් මස) නොපැත්වීමට කමිටුව තීරණය කරන ලදී.**

02. **රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.** **- ලේකම්, නගර සභාව**

- ❖ ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.

**2013- 03- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන ක්‍රියාකාරී කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -03- 19 දින පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලැබූ ක්‍රියාකාරී කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 03- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**සහභාගීත්වය**

| | | | |
|---|---|---|---|
| 01 | ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | - | ගරු සභාපති , නගර සභාව , අම්බලන්ගොඩ |
| 02 | එල්.එස්.ඒ ද සිල්වා මහතා | - | ඩොල්පින් ක්‍රීඩා සමාජය |
| 03 | කේ.ටී.ආර්.සුමනසූරිය මහතා | - | ඩොල්පින් ක්‍රීඩා සමාජය |
| 04 | සුගත් හෙට්ටිආරච්චි මහතා | - | |
| 05 | කේ.ජේ.තාලේව් මහතා | - | රියෝ ක්‍රීඩා සමාජය |
| 06 | එම්.ඩබ්.සිසිර කුමාර මහතා | - | කර්මාන්ත අධිකාරී |
| 07 | පී.ඩී.එස්.කේ.කුලතිලක මහතා | - | වැඩසටහන් සහකාර , නගර සභාව |
| 08 | එම්.එච්.රෝෂිණී මිය | - | කළමණාකරන සහකාර , නගර සභාව |

**ගරු සභාපතිතුමා**

ක්‍රීඩා කමිටුව සඳහා ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් , ක්‍රීඩා කමිටු සාමාජික මහතුන් හා නගර සභාවේනිලධාරීන් පිලිගැනීම හා පසුගිය සභා වාරයේදී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය

01 ක්‍රීඩා මණ්ඩපයේ වහල වෙනස් කිරීම හා ග්‍රීන් නෙට් එක ඉදි කිරීම පිළිබද තාක්ෂණ නිලධාරී වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම

02

මෙ සදහා තාක්ෂණ වාර්තාව සිසිර මහතාගෙන් ලිඛිතව ලබා ගෙන ඉදිරි ක්‍රීඩා කමිටුවට පදිරිපත් කල යුතු බව විෂය නිලධාරිට පැවසීම.

03 නගර සභා ක්‍රීඩාංගනයේ ධාවන පථය සලකුණු කිරීම සම්බන්ධව මිනින්දෝරු වාර්තාවක් ගෙන ධාවන පථය සලකුණු කිරීම හා මේ සදහා ටෙන්ඩර් කැදවා ඉදිරි කටයුතු සදහා සභාවට ඉදිරිපත් කරන ලෙස විෂය නිලධාරිට දැන්වීම.

04

**අදහස් හා යෝජනා**

මාදම්පාගම පිහිනුම් තටාකය අසල Changing room එකක් ඉදි කිරීම සම්බන්ධව තොරතුරු සාකච්ඡා කිරීම

**එල්.එස්.ඒ ද සිල්වා මහතා**

මෙ සදහා සුදුසු කොන්ත්‍රාත් කරුවකු හමු නොවුන බව පැවසීම

**ගරු සභාපතිතුමා**

මා විසින් මෙම කටයුත්ත කොන්ත්‍රාත් කරුවකුට පැවරූ බවත්, ඒ සම්බන්ධව සිදුකල යුතු ඉදිරි කටයුතු පිළිබද පැමිණ සිටි ක්‍රීඩා සමාජ සාමාජිකයින් සමග සාකච්ඡා කිරීම.

**එම් .ඩබ්.කේෂාන් මහතා**

මෙ සදහා කලින් සකස් කරන ලද පිඹුරුපතටම Changing room එක යාකර සකස් කල හැකි බව පැවසීම

**ගරු සභාපතිතුමා**

දැනට Changing room එක සඳහා රු ලක්ෂ 5-6 පමණ ප්‍රමාණයක වියදමක් දැරියයුතු බවත් , කලින් Plan එක හැර සරල ප්ලෑන් එකක් සකස් කර ඇති බවත් එයද බොහෝදුරට එම අවස්ථාවේ පෙන්නුම් කරන ලද ප්ලෑන් එකටම සමාන බව සදහන් කිරීම.

දැනට එම ස්ථානයේ පවතින ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමකින් තොරව එම ගොඩනැගිල්ලටම යා කර මෙම Changing room එක සකස් කල හැකි බවද දැන්වීම .

මේ සම්බන්ධව ඇති වෙනත් කරුණු

**ගරු සභාපතිතුමා**

Changing room එක සදහා වැසිකිළි සහ නාන කාමර පහසුකම් නැතිද යන්න විමසීම

**සිසිර මහතා**

දැනට සකස් කර ඇති Plan එකෙහි ඒවා සදහන් කර නොමැති බව .

**එල්.එස්.ඒ ද සිල්වා මහතා**

Changing room එක තුල ඇදුම් එල්ලීම සදහා සුදුසු පරිදි අදාල කාමර සකස් කල යුතු බව හා බංකු 02ක්ද සකස් කල යුතු බවත් , කාන්තා හා පිරිමි සදහා නාන කාමර 02 ක්ද ඒ සමගම සකස් කිරීමට අවශ්‍ය බව හා ඒ සදහා ෂවර් 02ක් සවි කිරීම පමණක් සෑහෙන බව සදහන් කිරීම.

**කේ.ටී.ආර්.සුමනසූරිය මහතා**

ජල නල පහසුකම් ලබා දෙන්නේ නම් බිල් ගෙවීමට හැකි බව පැවසීම.

**ගරු සභාපතිතුමා**

ජලය හා විදුලිය යන දෙක සදහාම බිල් පත් ගෙවීමට අදාල පාර්ශව වෙත පැවරීම සහ මෙම Changing room එක තුලට ආලෝකය ලබා ගැනීම සදහා කුමක් කරන්නේද යන්න විමසීම

**එල්.එස්.ඒ ද සිල්වා මහතා**

සිමෙන්තියෙන් සකස් කර ඇති ග්‍රිල් යොදා ආලෝකය ලබාගත හැකි බව

**සිසිර මහතා**

සියලු පහසුකම් සහිත ලෙස ඇස්තමේන්තු සකස් කිරීමේදී වියදම අධික බව පැවසීම

**කේ.ටී.ආර්.සුමනසූරිය මහතා**

මෙම ස්ථානයේ ඇති පිහිනුම් තටාකය නිසා මෙම ස්ථානයේ වටිනාකම වැඩි බවත් , උදෑසන 05.00 සිට පිහිනීම සදහා ළමුන් පැමිණෙන බැවින් විදුලියද අවශ්‍ය බව

**කේ.ටී.ආර්.සුමනසූරිය මහතා**

2013 ඔක්තෝබර් 13 දින ප්‍රථම වතාවට' " **Ambalangoda 05 Km** " ලෙසින් ජාතික මට්ටමින් පිහිනුම් තරගාවලියක් ගගේ පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් , මීට පෙර මෙම තරග ගොඩගම මුහුදේ පැවැත්වූ බවත් මෙය " **ශ්‍රී ලංකා ජාතික ජල ක්‍රීඩා සංගමය** " මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සදහා අවශ්‍ය කටයුතු සකසා දෙන ලෙසත් ඉල්ලා සිටීම.ඉන් තෝරාගන්නා ක්‍රීඩකයින් ජාත්‍යන්තර තරග සදහා තෝරා ගැනීමට කටයුතු කරන බව

**ගරු සභාපතිතුමා**

අම්බලන්ගොඩ මුහුදේ මෙය පැවැත්වීමට නොහැකි වීමට හේතු විමසා සිටීම.

**කේ.ටී.ආර්.සුමනසූරිය මහතා**

මෙය මුහුද දෙසට ගොස් නැවත ගොඩබිමට පැමිණීමෙන් තොරව, පවත්වනු ලබන බවත් ,අම්බලන්ගොඩ අවට මුහුදේ ගල් වැඩි බැවින් ඒ සදහා නුසුදුසු බවත් මේ වසරේ මෙම තරග Open Water ලෙස පවත් වනු ලබන බවත් පැවසීම

**කේ.ජේ.තාබ්‍රේව් මහතා** -

නගර සභා පාපන්දු සංචිතයේ ක්‍රීඩකයන්ට ශාරීරික අභ්‍යාස සදහා අවස්ථාවක් සකසා දීමට රියෝ ක්‍රීඩා සමාජය හා සිංහ ක්‍රීඩා සමාජ වෙතින් ලිඛිත ඉල්ලීමක් කරන ලෙස දැන්වීම

**සුගත් හෙට්ටිආරච්චි මහතා**

ක්‍රිකට් තරග පැවැත්වෙන අවස්ථාවලදී නගර සභා ක්‍රීඩාංගනය අසල පුළුල් තිරයක් මගින් තරග නැරඹීමේ අවස්ථාව සලසා දෙන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටීම හා කොළඹ නගරයේ එවැනි පහසු කම් සලසා තිබෙන බව පැවසීම

**ගරු සභාපතිතුමා**

දවල් කාලයේදී තිරය මත දර්ශන පැහැදිලි නොමැති බැවින් ,ක්‍රීඩාංගනය අවට වෙනත් ගැටළු මතු නොවන්නේ නම් ,ඉල්ලීමක් කලහොත් රාත්‍රී කාලයේදී එම පහසුකම් සලසා දිය හැකි බව සදහන් කරන ලදී.

**සුගත් හෙට්ටිආරච්චි මහතා**

නගර සභා පිටියතුලට ගවයන් ඇතුලුවීම වැලැක්වීම සදහා ග්‍රීන් නෙට් එකක් යොදා සකස් කර දෙන ලෙස ඉල්ලීම

**ගරු සභාපතිතුමා**

ඒ සදහා සැපයුම් පිළිබද විෂය දැනුවත් කරන ලෙස දැන්වීම

**පී.ඩී.එස්.කේ.කුලතිලක මහතා**

පැමිණ සිටි සියළු මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කරමින් එදින කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

සකස් කලේ -එම්.එච් රෝෂිණී - කළමණාකරන සහකාර

**2013- 03- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -03- 20 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 5** **2013- 03- 18** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**<u>සහභාගීත්වය</u>**

| | |
|---|---|
| ❖ ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ වෛද්‍ය පී ප්‍රනීත් මහතා. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීල අම්බලන්ගොඩ, |
| ❖ ඩී වී සුනිල් මහතා | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ එච් .එච්. ජයසේන මහතා | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී ඩී.එස්.කේ කුලතිලක මහතා | වැඩ සටහන් සහකාර, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී. එච්. එල් සී පුෂ්පරාණි මහත්මිය | සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ ඩබ්. එන්. අයි. මෙන්ඩිස් මහතා | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ බී. ඩී. ට්. කොඩිතුවක්කු මිය | ප. සෞ. සේ. නිලධාරිනි අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩී. එස්. ට්. ගමගේ මිය | ප. සෞ. සේ. නිලධාරිනි අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ එම ඒ නිමල පේමතිලක මහතා | ම සෞඛ්‍ය පරික්ෂක බලංගොඩ නගර සභාව |
| ❖ පී ප්‍රසාද් කුමාර මහතා | බලංගොඩ නගර සභාව |
| ❖ එච්. එච්. ඒ. ද සිල්වා මහතා | ග්‍රාම නිළධාරීල ඕකන්දග |
| ❖ එස්.එච් අජිත් ද සිල්වා | ග්‍රාම නිලධාරී කළුවඩුමල්ල . |

**පිළිගැනීම** :- **ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමා ඇතුළු සියළු නිලධාරි මහත්ම මහත්මීන් හා අනෙකුත් සියළුම රජයේ නිලධාරිනුත් , නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

**ඩෙංගු රෝග මර්ධන වඩසටහනේ ප්‍රගතිය**

ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා

වික්‍රමසූරිය පාර ඉංජිනේරු කාර්යාලය අසල ඉඩම තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පවතින බවට තොරතුරු ලැබී ඇති බව පවසන ලදි.

**ඔකන්ද ග්‍රාම නිලධාරී එච් එච් ඒ ද සිල්වාමහතා**

පොල්වත්ත දෙදුවස්ස මාර්ගයේ වැසිකිළිවලක් සම්පූර්ණයෙන්ම විවෘතව පවතින බව පවසන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා .**

අම්බලන්ගොඩ දුම්රිය ස්ථානයේ වැසිකිළිවලෙහි අපද්‍රව්‍ය දුම්රිය මාර්ගයට යාබද කාණුවට මුදාහැර ඇති බවට වාර්තා වු බවත් පොලීසියට දැනුම් දී එම තත්වය පාලනය කළ බවත් පැවසීය. මේ අස්ථාවේදී අවට ප්‍රදේශය පුරා දැඩි දුගදක් හමාගිය බවත් මෙම අපද්‍රව්‍ය දිගටම ගලා ගියේ නම් වෙලේ පන්සල පිටුපසින් ගොස් මාදම්පා ගගේ ළමයින්ට නෑමට ඉදිකර ඇති පිහිණුම් තටාකයට ගලායාම නිසා විශාල හානියක් සිදුවීමට ඉඩ තිබු බවත් පවසන ලදි'.

දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත මේ පිළිබඳ දන්වා යවන ලෙසත් උපදෙස් ලබාදෙන ලදි.

**දුම්රිය මාර්ගයේ දෙපස ඇති කාණුවල ජලය රැඳී තිබීම**

දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලිපයකින් දැනුම් දී ඇත

**.මහජන බැංකුව අසල සිට දුම්රිය මාර්ගය දක්වා කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම**

ඇස්තමේන්තු සකස් කර ඇත.

**සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා මාස තුනකට වරක් සායනයක් පැවැත්වීම.**

**වෛද්‍ය ටී ප්‍රණීත් මහතා**

2013 අප්‍රේල් මස 30 වන දින සෞඛ්‍ය සායනය පැවැත්වීමට හැකි බවත් එම දිනට පෙර දිනයක කාර්ය මණ්ඩලයේ සියළු දෙනා සඳහා බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් බදාදා දිනක පැවැත්වීමට හැකි බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

වෛද්‍ය සායනය පැවැත්වෙන දින රෝගින්ට නියම කරන බෙහෙත් ලබා දීමට අවශ්‍ය වියදම් සභාවෙන් දැරීමට අනුමැතිය ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.

**ම.සෞ.ප පී.එස්.එස්.ද.සිල්වා මහතා.**

ධූමායන කටයුතු සිදුකෙරෙන අවස්ථාවලදි දවස පුරා එම කටයුත්තෙහි නිරත වන විට එම තැනැත්තා සඳහා දිවා ආහාර ලබා දීමට සිදුවන බැවින් තමාට එම වියදම් දැරීමට සිදු වු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මුළු දවස පුරා ධූමායන කටයුතු සිදුකෙරෙන අවස්ථාවලදී එම කටයුතුවල යෙදෙන අය සඳහා දිවා ආහාර ලබා දීමට සභාව් අනුමැතිය ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි

**සුනඛ වන්ද්‍යාකරන සැත්කම සඳහා සභාව් අනුමැතිය ලබාගැනීම.**

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා.**

මෙම වැඩසටහන සඳහා සභාවේ අනුමැතිය ලැබී ඇති බවත් සුනඛයින් මැරීමට සයනයිට් සඳහා යන වියදම මේ සඳහා යොදා ගැනීම සුදුසු බවත් සභාවේ මේ පිළිබඳ සාකච්ඡා වු බවත් අයවැයෙන් ලක්ෂ තුනක පමණ මුදලක් වෙන්කර

තිබුණද එම මුදල ප්‍රමාණවත් නොවන බවත් සිංහ සමාජයෙන් ඉතිරි මුදල ලබා ගතහැකි බවත් ප්‍රකාශ කරන ලදි මෙම සැත්කම සිදුකරන වෛද්‍යවරයාගෙන් ඒ සඳහා යන වියදම් පිළිබඳ වාර්තාවක් ලබා ගන්නා ලෙසත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සහාය ලබා ගන්නා ලෙසත්, උපදෙස් ලබා දෙන ලදි. මේ අවස්ථාවේ ගණකාධිකාරී මහතා කැඳවා එවැනි ලිපියකට ගෙවීමේ හැකියාව ඇත්ද යන්න විමසන ලදි

එවැනි ලිපියකට ගෙවීමේ හැකියාව ඇති බව එම මහතා ප්‍රකාශ කරන ලදි

ඒ අනුව එපරිද්දෙන් කටයුතු කිරීමට කමිටුව තීරණය කරන ලදී.

**ම.සෞ.ප.පී.එස්.එස්.ද සිල්වා මහතා**

වන්ද්‍යාකරණ සැත්කම සිදුකෙරෙන අවස්ථාවේදී ජලභීතිකා එන්නත ද ලබාදෙන බැවින් එමගින් ජලභීතිකා රෝගයද පාලනය වන බව ප්‍රකාශ කරන ලදි.

මී ළඟට බලංගොඩ නගර සභාවේ ම.සෞ.ප.නිමල් ජෙමතිලක මහතාට කමිටුව අමතන ලෙස ආරාධනා කෙරිණි.

කම්කරුවන් සඳහා ගෙවනු ලබන වේතනයට සරිලන ප්‍රතිලාභයක් ප්‍රජාව වෙත ලබාදීම සඳහා කම්කරුවන් දැනුවත් කර ඔවුනට යම් ගුණාත්මක තනතුරු නාමයක් ලබාදිය යුතු බව ප්‍රකාශ කරන ලදි.ලංකාවේ අනෙකුත් පළාත් පාලන ආයතනවල කම්කරුවන්ට පවතින ප්‍රශ්න මෙම සභාවේ කම්කරුවන්ට පවතින බවත් , එම ගැටළුවලට විසඳුම් සෙවීම කෙසේ කළයුතුද යන්න ඔවුනට පැහැදිලි කළ බවත් ප්‍රකාශ කරන ලදි. ට්‍රැක්ටරයේ සීනුව නාද කිරීම හැකි ඉක්මනින් ආරම්භ කරන ලෙස මම සභාපති තුමාට සිහිපත් කරනවා. ඒකට රියදුරන් හරි කැමතියි. පාරට කසල දැමීම සිදු නොකරන ලෙස නිවෙස් අයිතිකරුවන් දැනුවත් කිරීම කම්කරුවන් විසින් සිදු කළයුතු බවත් දින තුනක් මේ ආකාරයට දැනුම් දී ඒ පිළිබඳ වාර්තා තබාගෙන කසල නොගෙන සිටීමෙන් මෙම තත්වය පාලනය කළ හැකි බව පෙන්වා දෙන ලදි තමා යන මාර්ගයේ වගකීම පිළිබඳ හැඟීමක් තමාට තිබිය යුතු බවත් අද දින සේවය කිරීමට අවශ්‍ය වාහනයේ ඉන්ධන ප්‍රමාණය පෙර දින ලබා ගැනීමෙන් පැය 1-2 ක කාල සීමාවක් ඉතිරි කර ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි මොනම හේතුවක් නිසාවත් මාර්ගයේ ගමන් කරන වෙලාව වෙනස් කිරීම සුදුසු නැහැ. මිනිසුන්ගේ විශ්වාසය කඩ නොවන ආකාරයට කටයුතු කළ යුතුයි.

නොදිරන අපද්‍රව්‍ය වෙන්කර විකිණීමටත්, ඉන් ලැබෙන ආදායම වෙනම ගිණුමක තැන්පත් කර එම ආදායමෙන් කම්කරුවන්ට වැටුප් ගෙවීම සිදු කළ හැකියි. නොදිරන ද්‍රව්‍ය වර්ග 21කට බෙදා වෙන් කර නගර සභාව සතු කඩකාමරයක එම ද්‍රව්‍ය තබාගෙන කාඩ් ක්‍රමයක් මගින් ගෙන එන ද්‍රව්‍ය සටහන් කර තබාගෙන ඒ සඳහා මිල නියම කිරීමක් සිදුකළ හැකියි. මේ වනවිට කම්කරුවන් යම් මුදලක් සොයා ගන්නා අතර එම ක්‍රමය විධිමත් කිරීමයි සිදු කළ යුත්තේ. එම ස්ථානය සම්පත් කේන්ද්‍රය නමින් නම් කිරීම සුදුසුයි

**ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා.**

බලංගොඩ ම.සෞඛ්‍ය පරීක්ෂක නිමල් මහතා බොහොම වැදගත් කරුණු කිහිපයක් පෙන්වා දීම සම්බන්ධයෙන් මම ඒ මහතාට ස්තූතිය පුද කරනවා.

**වෙනත් කරුණු**

ග්‍රාම නිලධාරී එච් එච් ඒ ද සිල්වා මහතා.

බුද්ධදත්ත විද්‍යාලය පිටුපස කාණුව ජලයෙන් පිරී තිබීම නිසා ජල හිරවීමක් පවතින බව.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා.**

ඔය ප්‍රදේශය අවට ඉඩම් ගොඩකිරීම තුළින් වතුර බැසීම තවත් අවහිර වෙනවා.

**ම.සෞ.ප.එච්එච්.ජයසේන මහතා.**

කාණුව පහත් කිරීම තුළින් යම් ප්‍රමාණයකට ජලය බැස්සවීම සිදු කළ හැකියි.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා**

අපි ඔය ස්ථානයේ ලක්ෂ 68ක වියදමින් කුඩා වැවක් ඉදිකළා. ඒ නිසා තමයි ඔය තත්වයෙන් හරි තියෙන්නෙ. අධ්‍යාපන අමාත්‍යංශයේ අනුමැතිය ලැබේ නම් ඔය ස්ථානයෙත් වැවක් ඉදි කළ හැකියි.මෙම ස්ථානය සඳහා ගත යුතු පිළියම කුමක්ද යන්න වැඩ අධිකාරී මහතා හා ම.සෞ. පරීක්ෂක මහතා මගින් වාර්ථාවක් ලබා ගන්නා ලෙස සභාපති තුමා උපදෙස් දෙන ලදි.

**<u>ස්තුති කථාව</u>**

**නගර සභා ලේකම් ඩී.වී. සුනිල් මහතා**

අද දින රැස්වීම සඳහා පැමිණි වෛද්‍ය ටී ප්‍රනීත් මහතාටත් බලංගොඩ නගර සභාවේ ම.සෞ.ප.නිමල් ප්‍රේමතිලක මහතාටත්,අනෙකුත් රජයේ නිලධාරීන් සියළු දෙනාටත් ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදි.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදි.

**2013- 03- 18** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -03- 18 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 6** **2013- 03- 12** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ස්වයංරැකියාලාභීන්ට නගර සභා සීමාව තුල ස්ථාන ලබා දීම පිළිබඳව කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**සහභාගීත්වය** :

| | |
|---|---|
| **ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මයා** | **- සභාපති, නගර සභාව** |
| **ඇම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මයා** | **- නගර සභා මන්ත්‍රී, නගර සභාව** |
| **ආර්. පී. දේවි රෝහාන් මයා** | **- නගර සභා මන්ත්‍රී, නගර සභාව** |
| **ඩී. වී. සුනිල් මයා** | **- ලේකම්** |
| **එම්. පී. ආර්. පුෂ්පකුමාර මයා** | **- ආදායම් අංශ ප්‍රධානී / සංවර්ධන සහකාර** |
| **වයි. පී. එස්. එම්. නයනජිත් මයා** | **- ආදායම් පරිපාලක** |
| **පී. පී. ඉල්ෂා මිය** | **- ආදායම් පරිපාලක** |
| **මංජරී ත්‍යාගා සමරසේකර මිය** | **- සංවර්ධන සහකාර** |

01. පිළිගැනීම හා අරමුණ පැහැදිළි කිරීම. **- ගරු සභාපති**

❖ අම්බලන්ගොඩ නගර සභා සීමාවේ ස්වයං රැකියාවන්හි නිරතවූවන්ට තම නිෂ්පාදන අලෙවි කර ගැනීම **- ගරු සභාපති**
සඳහා වෙළඳපොළ ආශ්‍රිතව අවස්ථාවන් නොලැබීම නිසා මහත් දුෂ්කරතාවයන්ට පත් වන අතර මේ පිළිබඳව විමර්ශනය කරනු ලදුව නගර සභාව විසින් ස්වයං රැකියාවන්හි නිරතවූවන්ට ස්ථාන ලබා දීමට අදහස් කර ඇති අතර ඒ මගින් බාහිර පිරිස් පරිභෝජනය කරනු ලබන, නගර සභාව විසින් භාවිතයට නොගන්නා බිම් ප්‍රමාණය ඵලදායී ක්‍රියාවලියකට යොමු කිරීමක් සිදු වන අතර නගර සභාවට යම් ආදායමක් උපයා ගත හැකි ක්‍රියාවලියක්

ද වේ. ස්වයං රැකියාවන්හි නියුතුවුවන්ට නියමිත ඉඩ ප්‍රමානයක් ලබා දෙන අතර, (තාවකාලිකව) ඒ සඳහා අය කර ගත යුතු මුදල ආදායම් පරිපාලක විසින් තක්සේරු කළ පසු අය කර ගැනීමට කටයුතු කළ හැකිය. මොවුන්ට ලබා දෙන මෙම ස්ථාන තාවකාලිකව ලබා දෙන අතර එහි සම්පූර්ණ අයිතිය නගර සභාව සතු වේ. මේ සඳහා මාසික කුලී මුදලක් අය කර ගැනීම සුදුසු වන අතර අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුම් ගත වී ස්ථාන ලබා දීම සුදුසු බවටත් කරුණු දක්වමින් 2012ග04ග03 වන දින සංවර්ධන සභකාර (විශේෂ) විසින් සභාවට ඉදිරිපත් කළ වාර්තාව අනුව මෙම කමිටුව රැස් වු බවටත් පැහැදිළි කරන ලදී.

❖ ස්වයං රැකියාවන්හි නිරතවුවන්ට සුදුසු ස්ථාන හඳුනා ගත යුතු බවත් ස්ථාන ලබා දීමේ දී සැබවින්ම ස්වයං රැකියාවන්හි නියුතු වුවන්ද යන්නත් මෙහිදී විශේෂයෙන්ම සොයා බැලිය යුතු බව. **- ගරු නගර සභා මන්ත්‍රී, රාහුල ලලිතවික්‍රම මහතා**

❖ එක් ස්ථානයක් තෝරා ගෙන ස්වයං රැකියාලාභීන් එහි ස්ථාපිත කරන්නේ ද යන්න. **- ගරු නගර සභා මන්ත්‍රී, දේවි රෝහාන් මහතා**

❖ එක් ස්ථානයක් නොව නගර බදව ඇති ස්ථාන කිහිපයක් හඳුනා ගෙන ඒ ඒ ස්ථානවල ස්ථාන ගත කිරීම සුදුසු බව. **- ගරු සභාපති**

❖ මෙවැනි ඉඩ සහිත ස්ථාන තිබෙන්නේ කොහිද යන්න. **- ගරු නගර සභා මන්ත්‍රී, දේවි රෝහාන් මහතා**

❖ බස් නැවතුම් පොළේ උඩ කොටසෙහි භාවිතයට නොගන්නා විශාල ඉඩ ප්‍රමාණයක් තිබෙන බවත් එම ඉඩ ප්‍රමාණයේ අනවශ්‍ය අය හැසිරෙන බවත් බස් නැවතුම් පොළ කණු වටා ද විශාල ඉඩ ප්‍රමාණයක් තිබෙන බවත් පෙන්වා දෙන ලදී. **- ගරු නගර සභා මන්ත්‍රී, රාහුල ලලිතවික්‍රම මහතා**

❖ බස් නැවතුම් පොළේ ලබා දිය හැකි ප්‍රමාණය අඩි 4ஜ4 හෝ 5ஜ5 පමණ විය යුතුයි. ඌරවත්ත පාලම අසළ මල් පැළ වෙළඳසැල් පවත්වා ගෙන යන්නන්ට ලබා දිය හැකි බවත් එම ස්ථානය නගරයට ඇතුළු වන ස්ථානය බැවින් අලංකාරයක් ලැබෙන බවත් එම ස්ථානයේ පදික වේදිකාවේ ගමන් කරන අයට එතරම් හානියක් ඇති නොවන බවත් ඒ ආකාරයට ස්වයං රැකියාවන්හි නිරත වුවන්ට එක් එක් අංශ අනුව වෙන් කර ස්ථාන ගත කිරීම සුදුසු බවත් පෙන්වා දෙන ලදී. **- ගරු සභාපති**

❖ ඌරවත්ත පාලම අසළ ඉඩ ප්‍රමාණය දුම්රිය දෙපාර්තමේන්තුවේ අයිතිය මත පවතින්නේද යන්න. **- ගරු නගර සභා මන්ත්‍රී, සරත් ශ්‍රීලාල් මහතා**

❖ එමඉ ඩ ප්‍රමාණය දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වුවද ස්ථාන ගත කිරීමට අපට හැකියාව ඇති බවත් අපේ මාර්ග අවහිර වන ලෙසට පවත්වා ගෙන යනු ලබන වෙළඳාම් කරන වෙළෙඳුන්, හඳුනා ගත් ස්ථාන වල ස්ථානගත කිරීමේ හැකියාව ඇති බවත් මෙම කරුණු සම්බන්ධව ආදායම් පරිපාලකවරුන්ගේ අදහස් කෙසේද යන්නත් විමසා සිටින ලදී. **- ගරු සභාපති**

❖ ගරු සභාපතිතුමා විසින් පැහැදිළි කරන ලද ආකාරයට වෙළෙඳුන් ස්ථානගත කිරීම සුදුසු බවත් මේ පිළිබඳව වැඩි දුරටත් කරුණු විමසා බැලිය යුතු බවත් පවසා සිටින ලදී. **- ආදායම් පරිපාලක**

❖ බස් නැවතුම්පොළෙහි කඩ කාමර වෙන් කරන්නේ නම් විදේශිකයන් ඉලක්ක කර ගනිමින් තොරතුරු මධ්‍යස්ථාන ලෙස පවත්වා ගෙන යාමට කටයුතු කරන්නේ නම් වඩා සුදුසු බව. **- ගරු නගර සභා මන්ත්‍රී, සරත් ශ්‍රීලාල් මහතා**

❖ ඌරවත්ත පාලම අසළ මල් වවන්නන්ගේ සංගමයට ආදී ලෙස වෙන් කර ලබා දෙන්නේ නම් නගරයට අලංකාර යක් ද ලැබෙන බව. **- ගරු නගර සභා මන්ත්‍රී, දේවි රෝහාන් මහත** )

❖ වෙළෙඳුන්ට වෙන් කර ලබා දීමේ දී ඊරුැබ හැළි එකකින් ආවරණය කර වෙන් කර ලබා දෙන ලෙසත් එවිට තමන්ට වෙන් කරන කොටස අලංකාර ලෙස සකස් කර ගනු ඇති බවත් එසේ වෙන් කර නොදුන් විට පදික වේදිකාව ද ආවරණය වන ලෙසට කඩ කාමර සකස් කර ගනු ඇති බවත් පෙන්වා දෙන ලදී. **- ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා**

❖ ස්වයං රැකියාලාභීන්ට ස්ථාන ලබා දීමේ ක්‍රමවේදය කුමක්ද යන්න. **- ගරු සභාපති**

❖ කරත්ත වල වෙළඳාම් කරන වෙළෙඳුන්ට මෙම ස්ථාන ලබා දිය නොහැකි බවත් එසේ වුව හොත් මෙය ගැටලුවක් වන බවත් පෙන්වා දෙන ලදී. **- ගරු නගර සභා මන්ත්‍රී, දේවි රෝහාන් මහතා**

❖ අදාළ නිර්ණායක තීරණය කිරීම ආදායම් පරිපාලකට භාර දෙන බවත් ආදායම් පරිපාලක ගේ නිර්දේශය මත ස්වයං රැකියාලාභීයෙකු නම් කිරීම කළ හැකි බව හා එසේ නම් කරන ලද ස්වයං රැකියාලාභීන් පිළිබඳව සභාව දැනුවත් කළ යුතු බව **- ගරු සභාපති**

❖ ත්‍රිරෝද කමිටුව වැනි කමිටුවක් පත් කර ඒ මඟින් ස්වයං රැකියාලාභීන් හා ස්ථාන ලබා දීම සුදුසුය යන්න තම අදහස බව. **- ගරු නගර සභා මන්ත්‍රී, දේවි රෝහාන් මහතා**

❖ මේ සඳහා අවශ්‍ය නිර්ණායක ආදායම් පරිපාලකවරුන් සකස් කිරීම සුදුසු බවත් ඒ අනුව පදික වේදිකාවේ වෙළඳාම් කර ඉවත් කරන ලද අය නැවත පදික වේදිකාවට නොපැමිණෙන ලෙසටත් අදාළ නිර්ණායක සකස් විය යුතු බවත් පෙන්වා දෙන ලදී. **- ගරු සභාපති**

❖ වෙස් මුහුණු සකස් කරන්නන් , චිත්‍ර අදින්නන් වැනි අයටද තම නිෂ්පාදන අලෙවි කර ගැනීමට ස්ථාන ලබා දීම **- ගරු නගර සභා මන්ත්‍රී, රාහුල ලලිතවිකම මහතා**

- ❖ ස්වයං රැකියාලාභීන්ට ලබා දෙනු ලබන ස්ථාන පිළිබඳව වාර්තාවක් ආදායම් පරිපාලකගෙන් ලබා ගන්නා ලෙස. - **ගරු සභාපති**
- ❖ ඔරලෝසු කණුව ඉදිරිපිට ත්‍රීරෝද රථ ගාල මේ සඳහා සුදුසු ස්ථානයක් ලෙස ගත නොහැකි ද යන්න. - **ආදායම් පරිපාලක**
- ❖ බස් නැවතුම් පොළ ඉදිරිපිට ඉඩම් කොටස ත්‍රීරෝද රථ සඳහා කොටසක් වෙන් කර ඉතිරි කොටස නගරයට පැමිණෙන සේවා ලාභීන්ට තම සේවා ලබා ගැනීමට පහසු වන පරිදි වෙන් කිරීම සුදුසු බව. එනම් යතුරු කපන්නන්, ඔරලෝසු හදන්නන් , සපත්තු මහන්නන් ආදී තැන තැන විසිරී සිටින අය එකම ස්ථානයක එක් රැස් කර ස්ථාපිත කිරීම මඟින් සේවා ලබාගන්නන්ට එය පහසුවක් බව. - **ගරු නගර සභා මන්ත්‍රී, සරත් ශ්‍රීලාල් මහතා**
- ❖ එම ස්ථානය පිළිබඳව සභාවේ දී මෙයට පෙර ද වේදිකාවක් තැනීමට යෝජනාවක් තිබු බව. - **ගරු සභාපති**
- ❖ එම යෝජනාව සුදුසු බවත් එවිට එක් එක් වෙළඳ ආයතනවලින් භාණ්ඩ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමේ දී එම ස්ථානය ලබා දිය හැකි බව. - **ගරු නගර සභා මන්ත්‍රී, දේවි රෝහාන් මහතා**
- ❖ සංචාරක වෙළෙඳුන් හා කරත්ත වලින් වෙළඳාම් කිරීම සම්බන්ධව ආදියට අතුරු ව්‍යවස්ථා සකස් කිරීම ද සුදුස බව හා ස්වයං රැකියාලාභීන්ට ස්ථාන ලබා දීම පිළිබඳව හා සුදුසු ස්ථාන පිළිබඳව වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලෙසට ආදායම් පරිපාලකවරුන්ට උපදෙස් ලබා දෙන ලදී. - **ගරු සභාපති**

- ❖ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම හා ස්තුති කථාව කිරීම. - **ගරු නගර සභා මන්ත්‍රී, රාහුල ලලිතවිකම මහතා**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

### 7:1 <u>ටෙන්ඩර්</u> :- නැත

### 7:2 <u>මිල ගණන්</u> :-

**7:2:1** පාවහන් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත සලකුණු කර ඇති මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | DSI Show room | BATA Show room | |
|---|---|---|---|---|---|
| 01 | කැන්වස් සපත්තු | 01 | 899.91 | 1499/- | |
| 02 | මේස් | 26 | 126/- | 169/- | |
| 03 | සෙරෙප්පු | 05 | 791.91<br>809.91 | 1199/- | |
| 04 | කළු සපත්තු | 25 | 1529.91<br>1349.91<br>1169.91<br>1124.91 | 1614.05 | |

**7:2:2** නිල ඇඳුම් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත සලකුණු කර ඇති මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Tata Tex | Abah Enterprises | Swico Textiles |
|---|---|---|---|---|---|
| 01 | White Shirt Materials | | 295/- + VAT<br>306/- + VAT<br>322/- + VAT<br>353/- + VAT | 306/-<br>375/- | 298/-<br>320/-<br>350/- |
| 02 | Blue Shirt Materials | | 295/ +VAT<br>353/- + VAT | 326/- | 306/- |
| 03 | Yellow Shirt Materials | | 295/ +VAT<br>353/- + VAT | 320/- | 306/- |
| 04 | Khaki suiting Materials | | 330/ +VAT<br>475/- + VAT | 450/-<br>675/- | 360/-<br>275/- |
| 05 | Black suiting Materials | | 365/ +VAT<br>635/- + VAT<br>775/- + VAT | 450/-<br>675/- | 475/-<br>390/-<br>405/- |
| 06 | White suiting Materials | | 330/ +VAT<br>475/- + VAT | 675/- | 360/- |
| 07 | White cotton Materials | | 460/ +VAT | 504/- | 460/- |
| | | | | | |

**7:2:3** ධූමායන යන්ත්‍රය සඳහා මිළ ගණන් කැඳවන ලද අතර කමිටුවෙන් දෙන ලද නිර්දේශය මත අදාල මිළ ගණන පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Suren Cooke Agencies | De Zoysa & Co.Pvt.Ltd | DTW Interítioíl | Germania colombo |
|---|---|---|---|---|---|---|
| 01 | Hand Operated Fogging Machine | | 165648/- | 277760/- | 207200/-<br>165760/- | 218400/- |
| | | | | | | |

**7:2:4** ස්ටිකර් මුද්‍රණය සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත සලකුණු කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Akra Photo | Sri Lankan Ads | Diamond Advertising |
|---|---|---|---|---|---|
| 01 | සිංහල ඉංග්‍රිසි දෙමළ භාෂා තුනෙන් මාර්ග නාමයන් ඇතුලත් ස්ටිකර් මුද්‍රණය<br>( නිල් පසුබිම සුදු පැහැ අකුරින් මුද්‍රණය විය යුතුය )<br>දිග 3’ පළල 1.5” | | 300/- | 950/-<br>1090/- | 700/- |

**7:2:5** කෙමිකල්ස් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **BKS Company** | **Indunil hardware** | |
|---|---|---|---|---|---|
| 01 | කෙමිකල්ස් | 50kg | 9450/- | - | |
| | | | | | |

**7:2:6** විදුලි උපාංග සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත හැගර වර්ගයේ මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **BKS Company** | **Asian Electricals** | **Jummerah Enterprises** |
|---|---|---|---|---|---|
| 01 | 7/0- 85 (Twin) වයර් | | 182/- | 156/- | 149/-+VAT |
| 02 | 62A අයිසොලේටර් (MCB) | | 6800/- | 2400/-<br>2800/- | 2600/- |
| 03 | 62A ට්‍රිප් ස්විච් (RCCB) | | 12100/- | 3800/- | 2800/- |
| 04 | 1” ø කන්ඩියුට් බට | | 115/- | 90/- | - |
| | | | | | |

## (08) ගෙවීම්

8. 1 ඇ. අංක 0439 යටතේ SL- 5694 අත්ට්‍රැක්ටරය සඳහා ලබා ගන්නා ලද ටයර් වෙනුවෙන් ගාලු පාර අම්බලන්ගොඩ, ආසිරි ටයර් සර්විස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 105418/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 600 X 16 Tyre | 2 X 10809 | = | 21618.00 |
| 12.4 – 11/20 Tyre | 2 X 41900 | = | 83800.00 |
| | | | 105418.00 |

8.2 ඇ. අංක 0454,456 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27832.50 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| A4 Packets | 27 X 585/- | = | 15795.00 |
| Type Writing sheets | 15 X 370/- | = | 5550.00 |
| Tipex | 37 X 50 | = | 1850.00 |
| Cello tape | 20 X 20 | = | 400.00 |
| Ruler | 35 X 27/50 | = | 962.50 |
| Paper pins | 25 X 23 | = | 575.00 |
| File Tags | 600 X 3.50 | = | 2100.00 |
| Paper Clips | 30 X 20 | = | 600.00 |
| | | | 27832.50 |

8.3 ඇ. අංක 0417 , 446 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12145/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| A4 Packets | = | 575 X 5 | = | 2875.00 |
| Colored A4 | = | 750 X 02 | = | 1500.00 |
| A4 Packets double A | = | 585 X 7 | = | 4095.00 |
| A4 Packets | = | 525 X 3 | = | 1575.00 |
| Gum bottle | = | 70 X 30 | = | 2100.00 |
| | | | | 12145.00 |

8. 4 කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ලබා ගන්නා ලද ලේඛන වෙනුවෙන් කුලියාපිටිය ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 19188/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Cash Books | 07 X 900 | = | 6300.00 |
| Pay registers | 01 X 495 | = | 495.00 |
| Loan registers | 01 X 900 | = | 900.00 |
| Main registers | 02 X 495 | = | 990.00 |
| Summary cash books | 04 X 618.75 | = | 2475.00 |
| Ledgers | 04 X 618.75 | = | 2475.00 |
| Rent Ledgers | 02 X 900.00 | = | 1800.00 |
| Bill Ledgers | 01 X 1200/- | = | 1200.00 |
| Three wheel register | 01 X 495/- | = | 495.00 |
| Revenue Register | 01 X 900/- | = | 900.00 |
| Other Revenue Register | 01 X 495/- | = | 495.00 |
| Welfair Rent Register | 01 X 495/- | = | 495.00 |
| | | | 19020.00 |
| Travelling | | | 168.00 |
| | | | 19188.00 |

8.5 ඇ. අංක 0270 යටතේ ලබා ගත් පදක්කම් වෙනුවෙන් අම්බලන්ගොඩ, සමාරා ප්ලාස්ටික් ඇන්ඩ් ග්‍රැෆික්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 81760/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Gold Meddles | 171 X 160/- | - | 27360.00 |
| Silver Meddles | 163 X 160/- | - | 26080.00 |
| | 177 X 160/- | - | 28320.00 |
| | | | 81760.00 |

8.6 ඇ. අංක 0465 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද භාණ්ඩ වෙනුවෙන් අම්බලන්ගොඩ, මහාවීදිය, ඉඳුනිල් හාඩ්වෙයාර් වෙත වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 13377/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| B/White Emulsion (10L) 01 | - | 6565.00 |
| Emulsion Whether shield 02X3406 | - | 6812.00 |
| | | 13377.00 |

8.7 ඇ. අංක 0464 යටතේ ලබා ගන්නා ලද ගබඩා භාණ්ඩ වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, පොල්වත්ත, පූර්ණ හාඩ්වෙයාර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 13320/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| පිත්තල සරනේරු | 36 X 120 | = | 4320.00 |
| පිත්තල ජනෙල් හැඩල් | 20 X 125 | = | 2500.00 |
| පිත්තල හුළං කොකු | 17 X 125 | = | 2125.00 |
| පිත්තල ජනෙල් මුදු | 20 X 45 | = | 900.00 |
| ඇණ | 320 X 7 | = | 2240.00 |
| ඇණ | 220 X 5 | = | 1100.00 |
| පීරි | 01 X 135 | = | 135.00 |
| | | | 13320.00 |

8.8 ඇ. අංක 0433 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද භාණ්ඩ වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි කොළඹ 12, අරලිය ස්ටීල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 21900/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Welded mesh 2 X 2 | 6 X 3650/- | = | 21900.00 |

8.9 ඇ. අංක 0429, 0430 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද භාණ්ඩ වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි කොළඹ 12, අරලිය ස්ටීල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 218950/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Shaf tine | 01 X 1400/- | - | 1400.00 |
| Bolt Nut | 20 X 150/- | - | 3000.00 |
| MS plate | 01 X 21000/- | - | 21000.00 |
| Welded mesh | 02 X 3650/- | - | 7300.00 |
| MS Channel | 02 X 6350/- | - | 12700.00 |
| L bar | 02 X 3500/- | - | 7000.00 |
| L bar | 12 X 2850/- | - | 34200.00 |
| MS plate | 10 X 11000/- | - | 110000.00 |
| Grinding Wheel | 10 X 175/- | - | 1750.00 |
| Cutting Wheel | 20 X 165/- | - | 3300.00 |
| Hacksaw blade | 18 X 150/- | - | 2700.00 |
| Hacksaw frame | 01 X 2600/- | - | 2600.00 |
| Welding rods | 10 X 1200/- | - | 12000.00 |
| | | | 218950.00 |

8.10 ඇ. අංක 0436 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි කොළඹ 12, අරලිය ස්ටීල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 224800/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| GI Pipe 2” | 08 X 6500/- | - | 52000.00 |
| GI Pipe 1 1/2” | 07 X 5250/- | - | 36750.00 |
| GI Pipe 3/4” | 25 X 2500/- | - | 62500.00 |
| GI Pipe 1/2” | 05 X 2050/- | - | 10250.00 |
| Roll Green Net | 04 X 14000/- | - | 56000.00 |
| Gate Bush | 12X 525/- | - | 6300.00 |
| MS Rod | 05 X 200/- | - | 1000.00 |
| | | | 224800.00 |

8.11 කාර්ය නියම කිරීමේ අංක 0279 යටතේ දැව ඉරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, පෝරඹ, ආර්. එම්. ජයසිරි මහතා වෙත රු. 48812/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.12 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 පෙබරවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13926.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3769 | ඩීසල් | 115 |

8.13 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 පෙබරවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16034.60 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3771 | ඩීසල් | 50 |
| 3781 | ඩීසල් | 37 |
| 3798 | ඩීසල් | 39 |
| | Engine Oil | 02 |

8.14 නගර සභාව සතු 49-9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 පෙබරවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12624.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3773 | ඩීසල් | 29 |
| | Engine Oil | 05 |

| | | |
|---|---|---|
| | Power steering Oil | 01 |
| 3785 | ඩීසල් | 18 |
| 3797 | ඩීසල් | 38 |
| | Engine Oil | 01 |

8.15 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 පෙබරවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 25309.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3768 | ඩීසල් | 50 |
| 3776 | ඩීසල් | 51 |
| 3786 | ඩීසල් | 60 |
| 3795 | ඩීසල් | 48 |

8.16 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 පෙබරවාරි මස 15-28 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 14895.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3823 | ඩීසල් | 123 |

8.17 නගර සභාව සතු 49-9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 පෙබරවාරි මස 15-28 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13355.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3814 | ඩීසල් | 50 |
| | Engine Oil | 02 |
| | පවර් ස්ටියරින් ඔයිල් | 01 |
| 3820 | ඩීසල් | 40 |
| | පවර් ස්ටියරින් ඔයිල් | 01 |

8.18 නගර සභාව සතු 49-9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 පෙබරවාරි මස 15-28 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11144.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3812 | ඩීසල් | 50 |
| 3821 | ඩීසල් | 38 |
| | එන්ජින් ඔයිල් | 01 |

8.19 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 19981.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3799 | ඩීසල් | 23 |
| 3800 | ඩීසල් | 43 |
| 3811 | ඩීසල් | 46 |
| 3817 | ඩීසල් | 53 |

8.20 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 පෙබරවාරි මස 15-28 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15743.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3806 | ඩීසල් | 50 |
| 3824 | ඩීසල් | 80 |

8:21 2013 ජනවාරි මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම්

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 II | 8,792.00 |
| 23453 II | 7,540.62 |
| 34453 II | 1,658.72 |
| 52453 II | 44,868.80 |
| 62453 II | 16,930.54 |
| | **79,790.68** |

ජල බිල්පත් සඳහා රු. **79,790.68** මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:22 2013 ජනවාරි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52454 | 18,975.15 |
| 52453 I | 32,347.15 |
| 62453 I | 16,079.16 |
| 34453 I | 4,818.75 |
| 23453 I | 1,402.50 |
| 11453 I | 37,291.51 |
| | 118,370.32 |

විදුලි බිල්පත් සඳහා රු: **118,370.32 ක** මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:23 2013 ජනවාරි මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 55,499.30 |
| 12452 | 1,163.28 |
| 25451 II | 2,859.58 |
| 62452 I | 1,163. 28 |
| | **60,685.44** |

දුරකතන බිල්පත සඳහා රු: **60,685.44** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8.24 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සඳහා 2013 පෙබරවාරි මාසයට ලබා ගත් පුවත්පත් වෙනුවෙන් රු. 33820.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 කළුවඩුමුල්ල හි පදිංචි එස්. එම්. නයනා නන්දනී මහත්මිය සමෘද්ධි ලාභියෙකු බැවින් ආදාහනාගාර ගාස්තු වෙනුවෙන් අයකල මුදලින් රු. 2000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි නැවත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 2013 පෙබරවාරි මස VAT මුදල් රු. 50000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවියගේ සහ ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතාගේ 2012 ඔක්තෝම්බර් සිට 2013 පෙබරවාරි මස දක්වා ගමන් වියදම් දීමනාව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 තල්ගස්ගොඩ බැද්ද ඉඩම හෙළිපෙහෙලි කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 1165462.70 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි තල්ගස්ගොඩ එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 2013 වර්ෂයට උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා රු. 796000/- ක මුදලක් දැරීමට ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 ඕකන්ද පෙර පාසල හා පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 287899.92 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරිගේ නිර්දේශය පරිදි 86E, ඕකන්ද සමෘද්ධි සංගමය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම මේ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෙ. මෙතන ලොකු රස්නයක් තිබුනෙ. සිවිලිම ගැහුවට පස්සෙ ඒ තත්වය හරි ගිහිල්ල තියෙන්නෙ.

8.31 පොල්වත්ත පෙර පාසල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 349312.02 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරිගේ නිර්දේශය මත බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 තල්ගස්ගොඩ පෙර පාසල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 353108.42 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරිගේ නිර්දේශය මත එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 පනියන්දුව කන්නන්ගර ඇල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තල්ගස්ගොඩ එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත රු. 39226.21 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 තල්ගස්ගොඩ පෙර පාසල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ අමතර වැඩ සඳහා අවසාන ගෙවීම වන රු. 25920/- ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි තල්ගස්ගොඩ එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.35 53- 0529 දරණ කැබ්රථයේ රක්ෂණ ආවරණය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය වෙත රු. 31114.52 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 GL - 9369 අංක දරණ ගලි බවුසරය 2013 වර්ෂයට රක්ෂණය කිරීම සඳහා රු. 68190.01 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.37 53- 0529 දරණ කැබ්රථයේ අළුත්වැඩියාව සඳහා රු. 15450/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි අසංග ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.38 හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ වරිපනම් අංක 80/71 සිට අංක 71 දරණ නිවාස අසල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 31546.65 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.39 හෙප්පුමුල්ල නාන ලිද ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 13912.69 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.40 පුටු සඳහා ලබාගත් රු. 1740/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි පද්මා සුජාතා ගුණවර්ධන මහත්මිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 මාර්තු මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 මාර්තු මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** විලේගොඩ එස්. ජී. ඒ. ද සිල්වා මාවතට ප්‍රවේශ වන වරිපනම් අංක 30/2 ස්ථානයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 621462.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒවගේම මෙම මාර්ගය නගර සභාවට පවරා ගැනීමටත් අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>**තීරණය**</u>

☞ **මෙම මාර්ගය නගර සභාවට පවරා ගැනීමට සහ ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** අළුත් පාර දෙමහල් සාප්පු සංකීර්ණය තීන්ත ආලේප කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 230409.85 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** කැටැන්තොට පෙර පාසල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 175965.80 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේ දෙවන හරස් පාර කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 391795.53 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** හෙප්පුමුල්ල පෙර පාසල සිවිලිම් සවි කිරීම හා කාණුව ප්‍රතිසංස්කරණය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 388612.03 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.6** මහජන බැංකුව අසලින් ඇති අළුත් පාරේ සිට දුම්රිය පාර දක්වා කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 390199.15 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** තල්ගස්ගොඩ පෙර පාසල අතිරේක වැඩ සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 25920.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.8** සුදුවැල්ල හරස් පාර තාර දැමීමේ සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 284343.56 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.9** විහාරගොඩ පාර ආරම්භක ස්ථානයේ පෙට්ටි බෝක්කුවක් සෑදීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 145934.80 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

🕘 **පෙ. ව. 10.20 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

🕘 **පෙ. ව. 10.20 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමි හේමන්තා මෙනවිය සභා ගර්භයට පැමිණෙන ලදී.**

**10.10** දළුක්කන්ද හරස් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 694644.06 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.11** පොකුණ පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 268719.33 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.12** හිරේවත්ත පිහිණුම් ස්ථානයේ ඇඳුම් මාරු කිරීමේ ස්ථානයක් ඉදිකිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 1337135.19 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (11) වෙනත් කරුණු

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **'** 2011 වර්ෂයේ කාර්ය සාධන තරගයේදී විනිශ්චයකරුවන් විසින් පෙන්වා දෙන ලද අප ආයතනයේ පවතින කාර්ය සාධන තරගයට අදාළ අඩුපාඩු **'** මැයෙන් සංවර්ධන සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

එක් එක් විෂයන් යටතේ දැනට පවතින අඩුපාඩු සහ තව දුරටත් වර්ධනය කර ගත යුතු කාර්යන් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ වාර්තාව ඉදිරිපත් කරල තියෙන්නෙ අපේ තියෙන අඩුපාඩු මන්ත්‍රීවරුන් දැනගන්න ඕන නිසයි. 2011 වර්ෂයේ අපි හෙ හොඳ මට්ටමක ඉන්නවා. තිබෙන අඩුපාඩු හදාගෙන 2012 ප්‍රශස්ත මට්ටමකට එන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම මාස අටකට විතර කලින් පෙන්නල දුන්න නගර සභාවෙන් හදපු පාරෙ වෝටර් බෝඩ් එකේ යන ලයින් එක කඩල දැනට අවුරුද්දකටත් ඉස්සර මම මතක් කරා. අද වෙනතුරුත් හැදිල නෑ. අද එතන කැලේ වැවිල. එතන ගෙදර මනුස්සය ඉස්සරහ පාර සුද්ද කරල තිබ්බහම ඒ කුණු ටික ගෙනියන්නෙත් නැහැ. අපි කියන්නෙ මේකයි මන්ත්‍රීවරු කැමතියි ලස්සනට තියාගන්න. නමුත් නිලධාරීන් දැනගන්න ඕනෙ ක්‍රමවේදය හදාගන්න. සුසාන භූමියේ කාණු ටික තාම සුද්ද කරල නැහැ. අනිත් එක සභාපතිතුමනි නිලධාරීන්ගෙ එකමුතුකම ඇතිකරන්න ඕනෙ. ගණකාධිකාරීතුමා දෙයක් කිව්වහම ලේකම් තුමා කිව්වහම අනික් අය දැනගන්න ඕනෙ එක කරන්න. ඔබතුමා ඉස්සෙල්ලම එක හදන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කරන්නෙ මහජනතාව සහ නිලධාරීන් අතර සුහදත්වය ඇති කිරීම සඳහා සහාය වීම. ලේකම්තුමා ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන් මේ සභාව ගන්නා තීන්දු ක්‍රියාත්මක කරන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මිනිස්සු අතරෙ නිලධාරීන් රකිනවා. අවසානයේදී දේශපාලන වශයෙන් අපට ඒ දේවල් එනව. මොකද නිලධාරියා සුද්ද පවිත්‍ර කරන්න ඒ තත්වය තුලදි අපි නැති තැනදි ඒ දේවල් ප්‍රකාශයට පත් වෙනවා. සභාපතිතුමනි බලය විමධ්‍යගත කරල තිබුනත් එක ප්‍රායෝගික තත්වයක් වෙලා නැහැ සභාපතිතුමනි. අපිට මේ සභාව සතුව සියළුම දේවල් තියෙනවා. මේ පරිසාධන තත්වයට පත් වෙන්න බැරි වෙලා තියෙන්නෙ මේ නිසයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සැලකීම අතින් නගර සභාව ඉදිරියෙන්ම ඉන්නවා. අපි තරම් කුඩා ළමුන්ට ලබා දෙන සහාය වෙන කිසිදු තැනක මම දැකල නැහැ. උදාහරණයක් විදියට ගත්තම ලෝක ළමා දිනය සැමරීම. නමුත් ඒ තියෙන පරිසාධන මට්ටම් වලට අපට ලගා වෙන්න බැරි ලිඛිත සාක්ෂි නොමැති වීම කියන දේදි යම් විදියකට අපි අපිම රවටා ගැනීමක් වෙනවා. මන්ත්‍රීවරුන්ට අපේ සභා සීමාව තුල දකින අඩුපාඩුවක් දන්වන්න පොතක් තියන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ පොතේ තියෙන දේවල් පැය 24 ක් 48 ක් ඇතුලත ඉටු වෙන ක්‍රමයක් හදන්න. මේ අඩුපාඩු සම්බන්ධයෙන් ප්‍රමාද වෙලා හෝ ක්‍රියාත්මක වෙන්න කියල මම ඉල්ලා සිටිනවා සභාපතිතුමනි.

🕔 **පෙ. ව. 10.35 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි නිලධාරීන් නිතරම දේවල් කියනවා. නමුත් ක්‍රියාත්මක වීමක් වෙන්නෙ නෑ. මම මීට කලින් කිව්ව පරණ පොල්වත්ත පාරෙ සුනිල ගෙදර ඉස්සරහ ගෙදර පාරත් අල්ලල කොන්ක්‍රීට් එක දාල. වතුර පිරිල කාණුවට කුණු පාරට

ඇවිල්ල පාරෙ යන්න බැහැ. මිනිස්සු සෑහෙන දොස් කියනවා. නිලධාරීන්ට අපි මේව කියන කොට ඒ අය ගිහිල්ල බලන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මමයි උප සභාපතිතුමයි වැඩ අධිකාරීතුමයි ගිහිල්ල බැලුව එතන.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ඔබතුමාල ගියා තමයි. නමුත් ඒ තාප්පෙත් අනවසරනෙ. මේ නගර සභා සීමාවෙ දුප්පත් කෙනෙක් ගෙ කෑල්ලක් හැදුවොත් කෙලින්ම නඩු. මේකට කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ඒවගේම ඒ ගෙදර කුණු ගන්න ගියහම ඒ අය නිදිනම් ඊට පස්සෙ නැගිට්ටම යනවලු කුණු ගන්න. ඒව නවත්තන්න ඕනෙ සභාපතිතුමනි. ඒවගේම සරත් මහත්මයගෙ කඩේ ඉස්සරහ කුණු ගොඩක්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කුණු ඇදීම සම්බන්ධව කිසිම චෝදනාවක් එන්න බැහැ දැන්. අවශ්‍ය දේවල් වුවමනාවටත් වඩා ලබා දීල තියෙනවා. තල්ගස්ගොඩයි පින්නදූවයි හැර අනික් සෑම තැනකම දිනපතාම කුණු අදිනවා. කුණු ඇද්දට පස්සෙ දාන අය උසාවි දාන්න. අපි නගරෙ අලංකාරයට මෙච්චර වියදම් කරනවා. අපි බැනුම් අහන්න ඕනෙ නැහැනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ඒවගේම එඬේරමුල්ලෙ තාප්පයක් බැන්දා. මම ඒක ලේකම් මහත්මයට දැනුම් දුන්නා. ඒකට මොකද වුනේ. මුකුත් නෑ. ඔන්න නිලධාරීන්ගෙ කටයුතු.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි නිලධාරීන් අතර තියෙන විරසකය නැති කරන්න ඕනෙ. අපි දෙයක් කිව්වත් මම පෙන්නල දීපු කාරණා රාශියක් තියෙනව මේ වන තෙක් කිසිම පරීක්ෂණයක් වත් කෙරිල නැහැ. සභාපතිතුමනි මේ ඇඟිලි සලකුණු යන්ත්‍රය සවි කරල මාස ගානක් වෙනව. මම අහනව මේ යන්ත්‍රයෙන් පරීක්ෂා කරල පඩි ගෙව්වද කියලා. එක නිලධාරියෙක් කාර්යාලයේ නැතුව මට ප්‍රින්ට් අවුට් එකක් ගන්න ඕන වුනා. තවත් ආරක්ෂක අංශයේ නිලධාරියෙක් පොතේ අත්සන් කරල ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සලකුණු කරල නැතුව මම ලේකම් මහත්තයට පෙන්නල දුන්නා. මට ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ප්‍රින්ට් අවුට් එකක් ගන්න දවස් තුනක් ගියා. ලේකම් මහත්තය නිලධාරියාට මේක අරන් දෙන්න කිව්වම මම දන්නෑ කිව්ව ගන්න. මේවගේ තත්වයක් සභාපතිතුමනි තියෙන්නෙ. ඒවගේම පී. එච්. අයි මහත්මය දැඩි වෙහෙසක් ගන්නව වැඩ කරන්න. නමුත් ඔබ තුමා ඔබතුමා යටතෙ ඉන්න සේවකයන්ට දෙන්නෙ නියෝග නෙමෙයි. ආයාචනා කරන්නෙ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් ඔබතුමා යටතේ ඉන්න සේවකයන්ට නියෝග දෙන්න කියලා. ඔබතුමා ඔබතුමාගෙ රාජකාරිය කරනවා. සභාපතිතුමනි අපි මේ නගර සභාව ලංකාවේ හොඳම නගර සභාව කරන්නට අපි නිලධාරීන් එක්ක එකතු වෙලා වැඩ කරමුයි කියල ප්‍රකාශ කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

සභාපතිතුමනි කාර්ය සාධන තරගයක් පවත්වන එක නගර සභාවකට හොඳ කටයුත්තක් කියන එකයි මම දකින්නෙ. 1986, 87, 88 වගේ කාලවලදි පළාත් පාලන අමාත්‍යාංශය මගින් තියපු තරග වලදි අපි දැක්ක නගරෙ තියෙන සෑම දෙයක්ම ක්‍රියාත්මක වෙනවා. කාර්යාලය, වැඩ අංශය, සෞඛ්‍ය අංශය, විදුලිය, පුස්තකාල, පෙර පාසල් සියල්ලම. ඒ තුලින් තමයි අපි එදා පළවෙනිය වුනේ. කොළඹින් කණ්ඩායම් ඇවිල්ල අවුරුද්දට තුන් වතාවක් බැලුව. එහෙම බලල ලකුණු දීල තමයි අපි ඒ තත්වෙට පත් වුනේ. අපිට ගණකාධිකාරීවරයෙක් හිටියෙ නෑ. පී. එච්. අයි කෙනෙක් හිටියෙ නෑ. ඒ කාලෙ තමයි අපි අඩුපාඩු හදා ගත්තෙ. මෙහිදී වාසි ගොඩාක් වුනා. සෑම පාරක්ම කාණුවක්ම හැදුව. අපි මන්ත්‍රීවරු ඇඟිලි ගහන්න ගියේ නෑ. නිලධාරීන්ටයි වැඩ බෙදල දීල තිබුනෙ. නිලධාරීන් ක්‍රියාත්මක කිරීම උඩ තමයි අපි ජයග්‍රහණය කරේ. උප සභාපතිතුමාගෙ කතාවෙන් තේරුනා ඇතුලෙ සමගියක් නෑ කියලා. එහෙම වුනොත් නම් කොහොමවත් දිනන්න බැහැ. අපේ අඩුපාඩුත් තියෙනවා. ඒ අඩුපාඩු හදාගන්න ඕනෙ. එතකොට අනිත් ලකුණු ටිකත් ගන්න පුළුවන් වේවි. එවගේම සභාපතිතුමනි මම දැකපු දෙයක් තමයි සමහර ගෙවල් හැදුවට පස්සෙ පාරත් අල්ලල අඩි තුනක් විතර කොන්ක්‍රීට් කරනවා. ගොඩක් තැන්වල ඒක තියෙනවා. ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර අනුමත කරනකොට අනිවාර්යෙන්ම ඒ වගන්තිය දාන්න පිවිසීමේ මාර්ග හැදීමේදී පාර අල්ලන්න බැහැයි කියලා. එවගේම සමහර තැන්වල අද වෙනකොට පාරවල් කැඩිල. ධම්මානන්ද පාර කැඩිල තියෙන්නෙ. සම්පූර්ණ හදන්න බැරිනම් පැච්වත් කරන්න.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

පාරවල් හැදීමේදී මේ දවස්වල පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ලංකාවෙම තාර හිගයක් තියෙනවා. ඒකයි වෙලා තියෙන්නෙ.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

කාණුත් කැඩිච්ච ඒව තියෙනවා. දේගොඩ පාරෙ කාණුව කැඩිල. මේ කරුණු සම්පූර්ණ කර ගත්තොත් කාර්යසාධන තරගෙ දිනන්න පුළුවන්. එතකොට අපට මුදල් පරිත්‍යාගත් හම්බ වෙනවා. එනිසා මම මේ කටයුතු කරගෙන යන්න ලේකම්තුමා, ගණකාධිකාරීතුමා, නිලධාරීන් සියළු දෙනා එකතු වෙලා කරන්න කියන එක මම කියා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්

සභාපතිතුමනි කාර්යසාධන තරගවලදි අම්බලන්ගොඩ නගර සභාව මීට පෙර පළවන ස්ථාන දෙවන ස්ථාන වගේ ස්ථාන ලබාගෙන තිබුන. ජයන්ත මහත්මය කිව්ව වගේ පාරවල් නඩත්තු කිරීම දැන් ටිකක් අඩුවෙන් කෙරෙන්නෙ. යම් යම් ස්ථාන අපි පෙන්නල දීල තියෙනවා. ඇල්ටන් මහත්මයට කීප වතාවක් කියල තියෙනවා. නමුත් තාම කෙරිල නැහැ. දැන් මම කියන්නෙම නැහැ. මම කියපු පොඩි පොඩි වැඩ එකක්වත් මේ කාල සීමාව තුල කරල නැහැ. අපිට ඡන්දය දුන්නු මහජනතාවගේ අවශ්‍යතා තමයි අපි කියන්නෙ. ඒව කරහම ලකුණු ලැබෙනව කාර්ය සාධනයෙදි. ඉස්සර කියන්නෙ අම්බලන්ගොඩ ඉඳල ඇස් පියාගෙන ගියත් කන්දෙගොඩට වැටෙන කොට කියන්න පුළුවන් කියල මේ කන්දෙගොඩ කියල. මොකද පාරවල් සවුත්තුයි. දැන් වෙලා තියෙන්නෙ ඒකෙ අනික් පැත්ත. මේක වෙලා තියෙන්නෙ පැච් කරන්නෙ නැති එකෙන්. ධීරක්කන්ධ මාවත , කොඩිකාර පෙදෙස පැච් කරන්න ඕනෙ. මම දැන් මේව අවුරුදු දෙකක් තිස්සෙ කියනව කෙරෙන්නෙ නෑ. මම සෞඛ්‍ය කමිටු ඇති කිරීම සම්බන්ධව ඔබතුමා දැනුවත් කරා. ඔබතුමා ඒක දැන් කරගෙන යනවා. මම ඉතාම කැමති දෙයක් තමයි සෞඛ්‍ය පැත්ත. අපි ගම්වල මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට ලොකු සහායක් ලබා දෙනවා. අපිත් ආසයි වැඩ කරන්න. මම ඩෙංගු වැඩසටහනක් වෙලාවෙදි ධනසේන මහත්මයත් එක්ක එක පාරක්

තෝරගෙන හරියටම සමීක්ෂණ කටයුත්ත කරා. ඒවගෙම නගර සභාවෙ පහත දාල තියෙනවා එක් එක් කාර්යට ගතවන කාලය. ඒව ඒ විදියට කෙරෙනව නම් හොඳයි. නමුත් සමහර අය මට කියල තියෙනව වැඩක් කර ගන්න ගියහම ඒ අය කල්ලි ගැහිල කතා කර කර ඉන්නව වැඩේට ප්‍රමුඛතාවය දෙන්නෙ නැහැයි කියලා. මම හිතන්නෙ ආදර්ශමත් විදියට මෙතන කටයුතු සිදු විය යුතුයි. මෙතෙන්ට එන්නෙ අපේ ඡන්ද දායකයෝ. මුලින්ම ඒ කෙනා සුහදව පිලිගත යුතුයි. අපට ලංකාවේ අංක එකට පත් වෙන්න පුළුවන් මේ කටයුතු සාර්ථකව කර ගත්තොත්.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි කාර්ය සාධනය ගැන කතා කරද්දි අම්බලන්ගොඩ නගර සභාව මම දකින ආකාරයට දකුණු පළාත තුල ඉහලින්ම සිටින බවයි මගේ මතය. සියළු අංශයන්ගෙන් වෙනත් පළාත් පාලන ආයතන සමග සැසඳීමේදී අපේ සභාව ඉදිරියෙන් සිටින බව මගේ වගේම පොදු මහජනතාවගේ මතයයි. මොකද පසුගියදා පැවති තරගයේදී සිද්ද වුනේ ලේඛන හරබයක් කියලයි මම හිතන්නෙ. එදින පරීක්ෂා කරනු ලැබුයේ අදාල ලිපිගොනු පමණයි. මම දකිනවා මෙම තරගයේ නිර්නායකයන්හි දැඩි දුර්වලතා තියෙනවයි කියලා. අම්බලන්ගොඩ නගර සභාවෙ වැඩි බරක් අදින අද්දැකීම් බහුල කර්මාන්ත අධිකාරීවරයෙක් ඉන්නව. අපි හදිසියකදි පවරන ඕනම වැඩක් ඉක්මනින් ඉටු කිරීමට මොහු පැකිලීමකින් තොරව ඉදිරිපත් වෙනවා. ඒවගේම තමයි අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා. පිරිසිදු කම අතින් අපි ඉහල ස්ථානයක ඉන්නවා. පොඩි දුර්වලතාවයකට මම දකින්නෙ සෞඛ්‍ය අංශය හා කර්මාන්ත අංශය අතර පොඩි භේදයක් තියෙනවා. සභාපතිතුමනි අපේ කෙරමිණියෙ නිවාස කීයක් තියෙනවා තමන්ගෙ ගෙදර ඉස්සරහ පාරත් උදලු ගානවා. නමුත් ඒ උදලු ගාපු තණකොල ටික මේ මිනිස්සුන්ට අරගෙන යන්න කිව්වහම අපේ අය කියනවා මේක අපට අයිති නැහැ මේක අයිති කර්මාන්ත අංශෙට කියල. දැනටත් ඒ අය පාර උදලු ගාල කුණුගොඩ තියාගෙන ඉන්නවා. එනිසා මම ඉල්ලා සිටින්නේ සභාපතිතුමනි සේවක මණ්ඩල කැඳවල රැස්වීමක් තියන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා සේවකයන් දැනුවත් කරන්න අදාල ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් කිව්වම අනිවාර්යෙන්ම ඒක ඉටු කරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙවැනි සුළු දේවල් පමණයි තියෙන්නේ. දැඩි ප්‍රශ්න ස්වභාවයක් නැහැ. අපි සභාවල් හය හතක වැඩ කරල තියෙන නිසා දන්නව. මෙතරම් වැඩ කරන සභාවක් අපි දැකල නෑ. අපේ කම්කරුවො කුණු අදිනවා. නමුත් ඒ ඇදල ආපු සැනින් නැවත පාරට කුණු වැටෙනවා. ඒකයි වෙන්නෙ. අපේ සභාව මීට වඩා තවත් උසස් තැනකට ගෙනයාමට ලේකම්තුමා අවශ්‍ය කටයුතු කරාවි යයි බලාපොරොත්තු වෙමින් නවතිනවා. ස්තුතියි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදී මහතුනි, නිලධාරීවරුනි, කාර්යසාධනය පිළිබඳව කතා කරන වෙලාවෙ අපි මීට ප්‍රථම යම් යම් ත්‍යාගයන් මේ සම්බන්ධයෙන් ලබාගෙන තියෙනවා. ඒ මීටත් වඩා අඩු සම්පත් යටතේ. එහිදී ඒ ගෞරවයෙන් 90% කට වඩා යන්නෙ සේවකයන්ට. එහෙම ගෞරවය ලබන සේවකයන්ට අපි බැලුවොත් පෙබරවාරි මාසෙ

වියදම් බැලුවොත් වැටුප් හා වේතන රු. ලක්ෂ හතලිහක්. සභාවෙ සාමාන්‍ය වියදම් වලට ගිහිල්ල තියෙන්නෙ ලක්ෂ හතලිස් පහයි. මේ තත්වය වෙන ආයන වල නැහැ. නමුත් මේක සේවා සපයන ආයතනයක් විදියට අපිට ඒකෙන් ගැලවෙන්න බැහැ. මේක පෞද්ගලික ආයතනයක් වුනානම් වෙන්නෙ මේකෙ අනික් පැත්ත. මම මෙහෙම කියන්නෙ සභාපතිතුමනි මේ සෑම සේවකයෙකුටම ඒ සේවයට අදාල වැටුපක් ලැබෙනවා. අතිකාල දීමනා ලැබෙනවා. යම් මට්ටමක පහසුකම් ලැබෙනවා. අපි මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සේවකයන් වෙනුවෙන් සියළු ගෙවීම් අනුමත කරල තියෙනවා. මේ සේවකයන්ගෙන් පෙරලා සභාවට සේවය කරල තියෙනවද කියල බලන්න ඕනෙ. අපි නියෝජනය කරන්නෙ නගරයේ මහජනතාව. අපි දොළොස්දෙනා නියෝජනය කරන්නෙ ඒ මහජනතාව නිසා මේ සේවකයන් මීට වඩා වගකීමක් කල යුතුයි කියලයි මගේ මතය. සෑම සේවකයෙකුටම එයාට පවරපු වැඩ රාජකාරී කොටසක් තියෙනවා. ඔය වාර්තාවලින් කියන්නෙ තමන්ට පවරන වැඩ ටික හරියට කරෙ නෑ කියන එකයි. අපි ඉහල නිලධාරීන් පත් කරල තියෙනවනෙ. මේ ඉහල නිලධාරීන් පහල නිලධාරීන් එක්ක ඝට්ටනයක් නැද්ද සුහදව තියෙනවද අන්න එහෙම තියෙනව නම් පළවෙනි ස්ථානයට අපිට එන්න පුළුවන්. පොඩි කාරණයක් තියෙනව සභාපතිතුමනි පුළුවන් නම් කරන්න. පිටින් එන නිලධාරීන්ට කලින් ඇයි මේ සේවකයන් මන්ත්‍රීවරුන්ගෙ අධීක්ෂණයට දාන්නෙ නැත්තෙ. අපි මෙතන කෑ ගැහුවට වැඩක් නෑ. මේ හැම අංශයක්ම මන්ත්‍රීවරුන්ට බෙදල අධීක්ෂණය කරන්න දෙන්න. අපිට කොච්චර වැඩ රාජකාරි තිබුනත් අපිට වගකීමක් පවරනව නම් අපි මේ සභාවෙ ඒ නිලධාරින් සම්බන්ධයෙන් මේ සභාවෙ උත්තර දෙන්න ඕනෙ. එතකොට මේකට ඇවිල්ල අපට නිකම්ම කෑ ගහන්න බැහැ. අනිත් එක සභාපතිතුමනි මේ සභාව තාක්ෂණයත් එක්ක තව ගොඩාක් ඉදිරියට ගන්න තියෙනවා. අපි හැමදාම එකම දේ කරන්නෙ සභාපතිතුමනි. මේ කුණු ප්‍රශ්නය රෑ දොළහට කුණු දාන අයට අපට නඩු දාන්න පුළුවන්ද? මම දැකල තියෙනව රෑට ඇවිල්ල නිදහසේ කුණු ටික දාල යන අය. ට්‍රැක්ටර් ටේලර්ස් කීපයක් තිබ්බ නම් මේ ප්‍රශ්නෙ ඉවරයි. එඬේරමුල්ල පාරෙ කුණු දාන තැන යන්න බෑ ගඳයි. ටේලර් එක දැම්ම නම් කුණු ටික අරන් ගියා දැම්ම. නගරයේ කුනු ගමේ කුනු වගේ නෙමෙයි. ඉක්මනින් නරක් වෙනවා. මේ සේවකයන්ට වුනත් අමාරුයි. මේව අවම කරන්න නම් සේවකයො යෙදවීම පුළුවන් තරම් අවම කරන්න ඕනෙ. අපිට ට්‍රැක්ටර් ටේලර ටිකක් ගන්න පුළුවන්. මේ කුණු බාල්දි අස් නොකරනව නෙමෙයි අස් කරල පැයෙන් ආපහු පිරෙනවා. සමහර තැන්වල අධික ලෙස කුණු එකතු වෙනවා. දුම්රියපොල පාරට ටේලර් එකක් අත්‍යවශ්‍යයි. ටේලර් එක දවස ගානේ හෝදල පිරිසිඳුව තියන්න ඕනෙ. මේක මම අවුරුදු ගානක් තිස්සෙ කතා කරනවා. කාර්යසාධනයෙන් ඇවිල්ල ඕක පෙන්නල දෙනකම් ඉන්න ඕනෙ නෑ. අපි පෙන්නල දීල තියෙනව මේ නගරෙ අඩුපාඩු. මේක අයාලෙ යන්නෙ සභාපතිතුමනි. නිවැරදි මාවතට ගත යුතුයි. සියළු දෙනාම එකම විදියට තම රාජකාරිය ඉටු කල යුතුයි. එහෙම කරොත් අපට පළවෙනි තැනට යන්න පුළුවන්.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ වාර්තාව මගින් තම තමන්ගේ වැරදි දැකල ඒවා නිවැරදි කර ගන්න පුළුවන්. ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කිව්ව වගේ මේ ක්‍රියාවලියෙ වරදක් තියෙනවා. සියල්ලම බලන්නෙ පොත්පත් වලින්. එනිසා මේ සියළු කරුණු අපි සම්පූර්ණ කර ගන්න ඕනෙ. ඇත්තටම අපි අනික් සභාවල් එක්ක බැලුවම සෑහෙන වැඩ කරනවා. ලංකාවෙ පළවෙනිය වෙච්ච සභාවට වඩා ඉදිරියෙන් අපි ඉන්නවා. නමුත් ලේඛන වලින් පළවෙනිය ඒ අය. අපි වැඩ වලින් වගේම ලේඛන වලින් පළවෙනිය වෙන්නත් යම් වැඩ කොටසක් කරන්න ඕනෙ. එකට ලේකම් මහත්මය ප්‍රමුඛ නිලධාරීන් තමන්ගෙ තියෙන අඩුපාඩු හදාගෙන ඉදිරියට යා යුතුයි. වෙනද අපි ශ්‍රේණිම් පැත්තෙන් පහල හිටියෙ. අද වෙනකොට අපි ඉස්සරහට ගිහිල්ල තියෙනවා. අපේ තියෙන්නෙ පොඩි පොඩි අඩුපාඩු. ඇත්තටම මේක නිලධාරීන් විසින් සාකච්ඡා කල යුතු දෙයක්. සභාවට යොමු කලේ මන්ත්‍රීවරුන් අපි ඉන්න තැන දැනගන්න ඕන නිසයි.

තීරණය

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:2** ' 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව ' අභ්‍යන්තර විගණන නිලධාරිණිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සභාගත කරන ලදී.

දීර්ඝ කාලයකට පසුව විගණන මතයක් ඉදිරිපත් වී ඇති බවත් එය සතුටට කරුණක් බවත් සභාවට දැනගැනීම පිණිස ඉදිරිපත් කරන බවත් දන්වා තිබුණි.

විගණන මතය ලෙස " මෙම වාර්තාවේ 2:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිලිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. " සඳහන්ව තිබුණි.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,

මම මේ සම්බන්ධයෙන් ගණකාධිකාරීවරයා ප්‍රමුඛ සියළුම අංශ වලට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒවගේම පොඩි හෝ අඩුපාඩුවක් තිබෙනවා නම් ඒවත් සපුරා ගන්න කියල ඉල්ලා සිටිනවා.

තීරණය

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:3** ' මූල්‍ය ප්‍රකාශනය - 2012 වර්ෂය ' මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය සභාගත කරන ලදී.

2012 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,

සභාපතිතුමනි ආයතනයක වැදගත්ම ප්‍රකාශනය තමයි අය වැය ලේඛනය. එය විගණකවරුන්ගෙ පරීක්ෂාවට ලක් වෙනව. ඊට පස්සෙ මේ ආයතනය මේ වසර පුරාවට කරපු කාර්යන් පිළිබඳව සංක්ෂිප්ත සටහනක් තබනවා. ඒක තමයි මූල්‍ය ප්‍රකාශනයක තේරුම. අපේ සභාවට 2012 වර්ෂයට විගණකවරුන් විසින් ඉදිරිපත් කරල තියෙන විගණන මතය අපි විශිෂ්ඨ අන්දමින් ලබල තියෙනවා. ඒ සම්බන්ධයෙන් අපි විශේෂ ස්තුතියක් ගණකාධිකාරීතුමා ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයටම පිරිනමනවා.

තීරණය

☞ **2012 වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශනය සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ‘ සිංහල/ හින්දු අළුත් අවුරුදු උළෙලට සමගාමීව අලෙවි පොලවල් පැවැත්වීම පිළබඳවයි ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වන අවුරුදු පොළ 2013- 04-10 හා 11 යන දෙදින අම්බලන්ගොඩ ධීවර සංකීර්ණ ශාලාවේදී පැවැත්වෙන බවත් ඒ සඳහා ධීවර සංකීර්ණ ශාලාව, ආරාධිත තොරණ සඳහා සැකිල්ල සහ ඩෙස් පුටු ප්‍රවාහනය සඳහා ටිපර් රථය නොමිලේ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **දිවි නැගුම අලෙවිපොළ පැවැත්වීම සඳහා 2013- 04- 10 සහ 11 දෙදින ධීවර සංකීර්ණය, තොරණ සඳහා සැකිල්ල, ඩෙස් පුටු ප්‍රවාහනය සඳහා ටිපර් රථය යනාදිය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ‘ 2013 වෙසක් උත්සවය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය සංවිධානය කරනු ලබන පුණ්‍ය කටයුතු සම්බන්ධවයි ’ මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013 වෙසක් උත්සවය නිමිති කොට ගෙන මරණයට කැපවුන ගවයන් මරණින් මුදා ගැනීමට කටයුතු කිරීම, ප්‍රදේශයේ ජනතාව ගව මස් කෑමෙන් වලක්වා ගැනීමට දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම, ගාළු පාර බෞද්ධ ධජ වලින් සැරසීම ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීම සඳහා ප්‍රචාරක වැඩසටහනක් 2013 මැයි මස 13 වෙනි දින සිට 23 දින දක්වා අම්බල්නගොඩ බස් නැවතුම්පොල ඔරලෝසු කණුව ඉදිරිපිට පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

මේ සම්බන්ධයෙන්ම තවත් ලිපියක් ඉදිරිපත් වී තිබෙනවා කේ. සී. ද සිල්වා, පෝරඹ, අම්බලන්ගොඩ. මරණයට කැපවුන ගවයන් නිදහස් කිරීමට එකතු කරන මුදල් නිසි ලෙස එයට නොයෙදීම. තරුණ බෞද්ධ සංගමය වසර කීපයක් මරණයට කැපවුන ගවයන් නිදහස් කර බවත් එය හොඳ වැඩක් බවත් නගර සභාවද එයට මුදල් එකතු කිරීමට අවසර ලබාදී එයට සම්බන්ධ වන බවත් නමුත් වසර ගණනක් ජනතාවගෙන් එකතු කල මුදල් නිසි පරිදි එයට නොයෙදවූ බවත් ඔවුන්ගේ අය වැය දැකීමෙන් එය පෙනෙන බවත් මෙවැනි මුදල් ගැරීමකට ඔබතුමාද හවුල් වන බව බදු ගෙවන්නන් සිතන බවත් එම නිසා මේ ගැන සිතා බලන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අම්බලන්ගොඩ බෞද්ධ නගරයක්. තරුණ බෞද්ධ සංගමය වැඩ සටහන් කීපයක්ම ඉදිරිපත් කරල තියෙනවා. ඇතුලෙ තියෙන දේවල් අපි දන්නනෙ නැහැ. අපෙන් දෙන්න ඕන සහාය අපි ලබා දෙන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්නීයගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ තරුණ බෞද්ධ සමිතියේ දැන් තරුණ ජව සම්පන්න පිරිසක් තනතුරු වලට තේරිලා ඉන්නෙ. අපි බස් නැවතුම්පොල ලබා දීම නොකරොත් මේ වැඩ සටහන් ටික පසුබානවා. මේ අළුත් නිලධාරි මණ්ඩලය යටතේ වැඩ කරගෙන යාමට එය ලබා දිය යුතුමයි කියල මම ප්‍රකාශ කර සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ලංකාවේ තියෙන බෞද්ධ නගරයක් අම්බලන්ගොඩ කියන්නෙ. එය ආරක්‍ෂා කර ගන්න අපි පාලකයො වශයෙන් කටයුතු කරන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ මුදල් එකතු කිරීමෙදි හරක් නිදහස් කරන්නම නෙමෙයි වෙසක් උත්සවයේ මුළු ව්‍යාපෘතීන් වෙනුවෙන්ම තමයි මුදල් එකතු කරන්නෙ. ඔය ගොඩනැගිල්ල ඉදිවෙලා තියෙන්නෙත් ඔය මුදල් වලින්. ඒ ආයතනය ගමට රටට සේවයක් කරල තියෙනවා. මේ වසරෙ තරුණ කොටස් ඉදිරිපත් වෙලා තියෙනවා ඒ කටයුත්තට. අපි ඒකට සහයෝගය දෙන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි සහෝදර මන්ත්‍රීවරුන් කියපු විදියට සමිතියක් අභ්‍යන්තරයේ තියෙන ප්‍රශ්නයක් අපට අදාල නැහැ. අපි විශ්වාස කරනවා මේ අය වගකීමෙන් වැඩ කරාවි කියලා. ඒ තත්වයක් තුල අපට ලබා දිය හැකි සහයෝගය අපි ලබා දෙමු කියල ඉල්ලා සිටිනවා.

තීරණය

☞ **2013 වෙසක් උත්සවය නිමිත්තෙන් සංවිධානය කරනු ලබන පුණ්‍ය කටයුතු වල ප්‍රචාරාත්මක වැඩසටහන සඳහා 2013 මැයි මස 13 වෙනි දින සිට 23 දින දක්වා අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඔරලෝසු කණුව ඉදිරිපිට ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ‘ 2013- 03- 29 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය වෙන්කරවා ගැනීම ’ මැයෙන් අම්බලන්ගොඩ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ දිසා රෝහල සහ ඇල්පිටිය මූලික රෝහල අතර 2013- 03- 29 දින පැවැත්වෙන ක්‍රිකට් තරගය සඳහා පොල්වත්ත ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **2013- 03- 29 දින පොල්වත්ත ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ‘ අම්බලන්ගොඩ අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා තරගාවලිය - 2013 ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

පසුගිය දිනවල පොල්වත්ත ක්‍රීඩාංගණයේදී පවත්වන ලද අන්තර් ක්‍රීඩා සමාජ තරගාවලි යසඳහා මුදල් අය කිරීමකින් තොරව ක්‍රීඩා පිටිය ලබා දීම වෙනුවෙන් ස්තුතිය පුද කරන බව දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:8** ‘ ආගමික කටයුත්තක් සඳහා ප්ලාස්ටික් පුටු 150 ක් ලබා ගැනීම පිණිසයි ’ මැයෙන් පටබැඳිමුල්ල, සිරි නිකේතාරාමාධිපති හිමියන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

විහාරස්ථානයේ සලපතල මළුවෙහි ගල් ඇතිරීමට ආධාර පිණිස මහින්දාගමනය චිත්‍රපටය පෙන්වීමට අදහස්කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු 150 ක් නොමිලයේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **සිරිනිකේතාරාම විහාරස්ථානය සඳහා 2013- 03- 17 දිනට ප්ලාස්ටික් පුටු 150 ක් නොමිලයේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** ‘ පල්ලෙතොට බැද්ද නිවාස 56 අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගන්නා ලෙස ඉල්ලා සිටීම ’ මැයෙන් ගොඩගේන රතුකුරුස නිවාස ගම්වාසීන්ගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම නිවාස වල ජීවත් වන්නේ සුනාමි ව්‍යසනයට ගොදුරු වූ හිරේවත්ත හා පටබැඳිමුල්ල ප්‍රදේශවල ජනතාව බවත් මෙහි පාලනය අයිති අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවට බවත් එනමුත් මෙම නිවාස වල අය අම්බලන්ගොඩ අය නිසා කිසිදු දෙයක් ප්‍රාදේශීය සභාවෙන් කරගත නොහැකි බවත් එම නිසා මෙම නිවාස 56 පමනක් අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගන්නා ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

🕘 **පෙ. ව. 11.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා සභා ගර්භයෙන් පිටව යන ලදී.**

**12:10** ' ඖෂධ වර්ග මිලට ගැනීම සඳහා ' මැයෙන් ආයුර්වේද වෛද්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය ඖෂධ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **නිදහස් ආයුර්වේදය සඳහා අවශ්‍ය ඖෂධ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ' දොළොස්මහේ සල්පිල ' මැයෙන් ලලිත් හැළඹගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

එළඹෙන නව වසර වෙනුවෙන් මහජනතාව විශාල වශයෙන් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දොළොස්මහේ සේල් පොළට පැමිණෙන බවත් ඔවුන්ගේ පහසුව සඳහා රීගල් සිනමාහල ඉදිරිපිට මාර්ගය මහජනතාවට කිසිඳු අවහිරයක් නොවන අයුරින් යකඩ පයිප්ප වලින් තාවකාලික සෙවනක් සෑදීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2013- 04- 13 දින දක්වා රීගල් සිනමාහල ඉදිරිපිට පාර ජනතාවට අවහිරයක් නොවන සේ සෙවනක් කිරීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ' මාර්ගය නගර සභාවට පවරා ගැනීම ' මැයෙන් පී. එච්. ඩී. එස්. නිහාල්, එම්. එල්. වරුසවිතාන, ජේ. ඩබ්. හසින් කුමාර ද සිල්වා යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉහත නම් සඳහන් අයගේ නිවාස වලට ප්‍රවේශ වන මාර්ගය නගර සභාවට පවරාගෙන එය සංවර්ධනය කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඉහත සඳහන් මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ' ධූමායන කටයුතු සඳහා සහභාගී වන අය වෙනුවෙන් දිවා ආහාරය සැපයීම ' මැයෙන් සංවර්ධන සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

2013- 03- 18 දින පැවති සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේදී සාකච්ඡා වු පිරිදි දවස පුරා ධූමායන කටයුතු වල යෙදෙන අය වෙනුවෙන් දිවා ආහාරය සඳහා වැය වන මුදල සභාවෙන් දැරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ධූමායන කටයුතු දවස පුරා සිදු කිරීමේදී ඒ සඳහා සහභාගී වන අය වෙනුවෙන් දිවා ආහාරය සහා අරමුදලෙන් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ' එක්සත් මාළු වෙළඳ සංගමය මගින් පැවැත්වෙන සංගීත ප්‍රසංගය සඳහා අවසර ලබා ගැනීම ' මැයෙන් එක්සත් මාළු වෙළඳ සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

එක්සත් මාළු වෙළඳ සංගමය මගින් දෙවන වරටත් පවත්වන සංගීත ප්‍රසංගය 2013- 04- 28 දින අම්බලන්ගොඩ ධීවර වරාය භූමියේ පවත්වන බවත් ඒ සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **2013- 04- 28 දින සංගීත ප්‍රසංගය පැවැත්වීම සඳහා ධීවර වරාය භූමිය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:15** ' රත්ගම ඉඩන්තොට ප්‍රාථමික විද්‍යාලයේ පිහිටීම හේතුවෙන් අම්බලන්ගොඩ ප්‍රදේශවාසීන්ගේ දරුවනට ප්‍රදේශයේ පාසල්වලට ඇතුලුවීමේ අවස්ථාව අහිමිවීම ' මැයෙන් ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජනිත් වික්‍රමතිලක මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා යන අය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත නම සඳහන් පාසල පිහිටා ඇත්තේ මාදම්පාගමෙන් එගොඩ ප්‍රදේශයක බවත් මහ අම්බලන්ගොඩ ප්‍රදේශයට මෙය ගුවන් දුර අනුව යම් ආසන්නතාවයක් පැවතුනද ඒ සඳහා මීටර 300 ක පමණ ජලාශයක් තරණය කල යුතු බවත් මාර්ග දුර අනුව කි. මි. 3.5 ක පමණ දුරක් යායුතු වුවද ඊටද පොදු ප්‍රවාහන පහසුකම් නොමැති බවත් තත්වය මෙසේ තිබියදී ගා/ධර්මාශෝක මහා විද්‍යාලය, ගා/ දේවානන්ද මහා විද්‍යාලය, ගා/ පී. ද එස්. කුලරත්න විද්‍යාලය, ගා/ ප්‍රජාපති බාලිකා විද්‍යාලය යන විදුහල් 04 සඳහා ඇතුලත් වීමේ අවස්ථාව මහ අම්බලන්ගොඩ දරුවනට අහිමි වී ඇති බවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීමේ චක්‍රලේඛයේ ද ජල දුර්ග උැති තැන්වලදී එම තත්වයන් මග හරින ලෙස දන්වා ඇති නමුත් මෙම පාසල් එයද අවබෝධ කර ගෙන නොමැති බවත් මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර ඉහත අසාධාරණය නිවැරදි කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ළමුන්ට ග්‍රාමිණී විද්‍යාලයට කැපෙන ලකුණු පහ නොකැපෙන අවස්ථාවක මෙම විද්‍යාලයට ලකුණු පහක් කැපීම නිසා නැවතත් අසාධාරණයක් සිදු වෙනවා. මහ අම්බලන්ගොඩ, මානිමුල්ල, හිරේවත්ත, තුඩුවමුල්ල ප්‍රදේශවල දරුවන්ට සිදුවන අපහසුතාවය පිළිබඳව අපි කනගාටුවට පත් වෙන අතරම මේ ජල දුර්ගය පසු කරන්නට ඔරුවක්වත් නොමැති තත්වයක් තුල මෙම ලකුණු පහ ඉවත් කිරීම සම්බන්ධව කනගාටුවට පත්

වෙනවා. මෙම රත්ගම ඉඩන්තොට පිහිටි ප්‍රාථමික විද්‍යාලයට දරුවන් ඇතුලත් කිරීමට එකදු අයදුම්පතක්වත් නොලැබීම ඉතා ශෝචනීය තත්වයක් තුල අම්බලන්ගොඩ දරුවන්ට මෙවැනි පාසලක් හේතු කොට ගෙන ලකුණු කැපීම පිළිබඳව අපි දැඩි කලකිරීමට පත්ව සිටිනවා. මේ දරුවන්ට සිදු වෙච්ච අසාධාරණයට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියල අම්බලන්ගොඩ නගරවාසීන් වෙනුවෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, අධ්‍යාපන අමාත්‍යතුමාටත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක තුමියටත් දන්වා යවන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි, මගේ ළගටත් ආව දෙන්නෙක් ලියුමක් ගන්න. ඒ අය උපන්දා ඉඳලම තුඩුවමුල්ල ප්‍රදේශයේ පදිංචි අය. සම්මුඛ පරීක්ෂණයෙදි කිව්වලු මන්ත්‍රීතුමාගෙන් ලියුමක් ගේන්න කියල. උදේ පාන්දරම ඒ අය ආව අපේ ගෙදරට. මේ ළමයින්ගෙ ප්‍රශ්නෙ ගැන කතා කරන කොට මම මීට පෙරත් කියල තියෙනව මේක දැන්ම වලක්ව ගත්තෙ නැතිවුනොත් ඉදිරියේදී අම්බලන්ගොඩ ළමයින්ට මේ පාසල් වලට යන්න බැරි වෙනවා. අපි මේ සරකල් එක සම්බන්ධයෙන් අපේ ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කරල අධ්‍යාපන අමාත්‍යතුමා එක්ක සාකච්ඡාවක් කරල මේ අභස්දුර නැති කර ගත්තොත් මේකට හොඳ පිලිතුරක් ලැබෙනවා. අපි සභාවක් විදියට මේ ළමයි වෙනුවෙන් පයින් යන දුර කිලෝ මීටර ප්‍රමාණයක් ඇතුලත ඒ න්‍යායට එන්න සැදීම තමයි මේකට තියෙන පිළියම. ඒ නිසා සභාපතිතුමා අපි මන්ත්‍රීවරුන් විදියට මේකට මැදිහත් වෙලා පිකටින් එකක් හරි කරන්න පුළුවන් නම් මම එතනදි ඔබතුමන්ලත් එක්ක ඉන්න බව කියමින් මම නිහඩ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, අපි ග්‍රාමිණී විද්‍යාලය ඉවත් කරා. ධම්මකුසලය ඉවත් කරා. මේකත් ඉවත් කරන්න වෙනවා. අපි මන්ත්‍රීවරුන් එකතු වෙලා අධ්‍යාපන අමාත්‍යාංශයට ගිහිල්ලා සාකච්ඡාවකට භාජනය වුනා නම් හොඳයි. ඉදිරියට මම හිතන්නෙ චක්‍රලේඛන වෙනස් කරනවා. ඉස්සරහට මේ ප්‍රශ්නෙ එන්න එන්න වැඩි වෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය අපි මැදිහත් වෙලා විසඳමුයි කියා මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, මේ දේ හරිම අසාධාරණයි. මම දකින දෙයක් තමයි ධර්මාශෝක විද්‍යාලෙට මේ ගමෙන් එහාට ඉස්කෝල ගැන බැලුවෙ නෑ. මම ගියා ළමයෙක්ගෙ ප්‍රශ්නෙකට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය ලගට. එතුමිය කිව්වෙ නගරෙන් පිට ඉස්කෝලයක් දෙන්නම් කියලා. මට දැඩි වේදනාවක් ආව ඇත්තටම. අපිට මෙතනදි කරන්න තියෙන්නෙ නගර සභාව විදියට විදුහල්පතිවරුන්ගෙන් ඉල්ලීමක් කරන්න මණ්ඩලයට තීරණය කරන්න කියලා. සභාපතිතුමනි ඔබතුමා ඉල්ලීමක් කරන්න මේක අපි සාකච්ඡා කරා මේ ගැන අවධානය යොමු කරල ඒ දරුවන්ට අවස්ථාව ලබා දෙන්න කියල ඉල්ලීමක් කරන්න. එවගේම ප්‍රධාන අමාත්‍යතුමාටත් පිටපතක් දාල දැනුවත් කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මෑත කාලයේදී මම අහපු පළමු අවස්ථාව මේ ඉඩම්තොටට ලකුණු කැපුව. මේක විශාල අසාධාරණයක්. අපිට ළමයි ගන්න කියල අභියෝග කරන්න බෑ. අපිට ඉල්ලීමක් කරන්න පුළුවන්. එත එවට ප්‍රතිචාර නැහැ. ඒ නිසා අපි සියළුම දෙනා මේකට ගිහිල්ල අදාල බලධාරීන් එක්ක සාකච්ඡා කරල මෙය ඉතා ඉක්මනින් විසඳා ගන්නා හැටියට ඉල්ලා සිටිනවා. ඒ වගේම අදාල සිතියම සභාවට ගෙන්වා ගන්නා හැටියටත් මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සම්බන්ධයෙන් සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුද කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශ ගරු ලේකම්තුමාටත් ගරු අමාත්‍යතුමාටත් සභාවේ තීරණයක් ලෙස දැනුම් දීමක් කරන්න කියල. ඒවගේම ප්‍රධාන අමාත්‍යතුමාටත් යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

**ප. ව. 12.30 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා සභා ගර්භයෙන් පිටව යන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි, අනුර කිත්සිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව මේ සම්බන්ධයෙන් අපි වරින් වර මේ සභාවෙ කතා වෙලා තියෙනවා. මේ දේවල් නිවැරදි කරන්න නම් අපි ඉදිරිපත් වෙන්න ඕනෙ. එක් වර්ෂයකදී පල්ලියබඩ වත්තෙ ගෙවල් 54 ටම එක අයිතිකාරයයි ඉන්නෙ. මම කම්ටුවෙදි අභියෝග කරා නගර සභාවෙන් දෙන සහතිකේ නීත්‍යානුකූල ලියවිල්ලක් කියලා. මේකට ලකුණු 10 දෙන්න කියලා මම කිව්ව. අමාත්‍යාංශ ලේකම්ගෙන් අහල ඒ ලකුණු 10 දුන්නා. අනික් කාරණාව ග්‍රාමසේවක මහත්මයගෙ සහතිකය. සෑම වසරකම ළමයි 30 ක් විතර තාවකාලිකව පදිංචිය දාල විද්‍යාලවලට ඇතුල් වෙනවා. ආදදොල කෙනෙක් බෝගහවත්තෙ ලිපිනයක් දාල ළමය ඇතුලත් කරා. ඊට පස්සෙ අවුරුද්දෙත් ළමයි 18 ක් නීත්‍යානුකූල ලියවිලි දීල ඇතුලට ගියා. මේ ග්‍රාම සේවක සහතිකය දීම තුල අනිවාර්යෙන්ම ගමේ ළමයි 20 කට විතර අසාධාරණය වෙනවා. අනිත් එක ගුවන් දුර තමයි ප්‍රශ්නය. මේක ඉස්සෙල්ලම අපි මානව හිමිකම් කොමිසමට ලියන්න ඕනෙ. අපි මේ පාසල් වලට ළමයි ඇතුලත් කිරීම සම්බන්ධව කොච්චර වාද විවාද කරත් මේ කාරණා ප්‍රායෝගිකව කරන්නෙ නැත්තම් අපි කතා කරාට වැඩක් නෑ. ගුවන් දුර ඉවත් කරොත් විශාල සහනයක් මේ ගමේ ළමයින්ට තියෙනවා.

**ප. ව. 12.35 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා සභා ගර්භයෙන් ඉවත්ව ගිය බැවින් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මුලාසනයේ අසුන් ගන්නා ලදී.**

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

අපි මේ ගැන හැමදාම මේ ගැන කතා කරනවා. මේකට ක්‍රියාත්මක වීම තමයි විය යුත්තේ. අපි කොට්ඨාශ 13 ග්‍රාම නිලධාරිවරුන් ගෙන්නල සාකච්ඡාවක් තිබ්බනම් හොඳයි කියන එක තමයි මගේ අදහස. අද වෙනකොට කුලරත්න විද්‍යාලෙට ළමයි ඇතුලත් කර ගන්න ලියා පදිංචි වෙන්නෙ ගොඩහෙනට. අපි මේ ග්‍රාම නිලධාරිවරුන් දැනුවත් කරා නම් මේක විසඳන්න මූලිකම දේ වෙනවා.

**තීරණය**

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මේ සඳහා තීරණයක් ගැනීමට ගරු අධ්‍යාපන අමාත්‍ය ලේකම්තුමාට දන්වා යැවීමට තීරණය කරන ලදී.**

## වෙනත් කරුණු

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි, මට ලිපියක් එවල තියෙනව පී. එච්. වසන්තා ලාලනී මහත්මිය. අපවිත්‍ර ජලය සමග දුගඳ ජලය පොදු කානුව වෙත බැහැර කිරීම කියලයි තියෙන්නෙ. මේ ගැන සොයල බලල කටයුතු කරන්න කියලයි තියෙන්නෙ.

<u>**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

මේක අපේ කාර්යාලයේ නිලධාරියෙක් සමග තියෙන ප්‍රශ්නයක්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන් ලවා මේකට පරීක්ෂනයක් කරා. ඒ නිලධාරීන් වාර්තව දීල තිබුනෙ අපිරිසිදු ජලය ගලා යන්නෙ නැහැයි කියලයි. ඒ වාර්තාවෙ තීන්දුව එම හත්මියට යොමු කරන්න කටයුතු කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි කොබෙයිතුඩුව විමලකිත්ති ස්වාමීන් වහන්සේගේ නමින් දළුක්කන්ද පාර 2001-10-03 සභාවේදි ඔබතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් යොමු කරල තියෙනවා. ඒ යෝජනාවෙ තත්වය කුමක්ද කියලයි මම අහන්නෙ.

<u>**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

මේක 2001 දි මම යෝජනා කරල ඔබතුමා ස්ථිර කරල තියෙනවා. 2002 දි මේ සභාව නියෝජනය කරන්න මට වරම් ලැබුනෙ නෑ. නැවත මම 2006 තමයි සභාව නියෝජනය කරෙ. මෙතෙක් කල් මේකෙ ඉදිරි කටයුතු කෙරිල නෑ. මේ සම්බන්ධව දැනුවත් කිරීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙහි ඉදිරි කටයුතු කිරීමට තීරණය කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්නියගේ මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි කළුවඩුමුල්ල ග්‍රාමීය වැඩිහිටි සමිතිය ඉල්ලීමක් කරනවා මේ මස 21 වෙනිදා පැවැත්වෙන අවුරුදු උත්සවය සඳහා කළුවඩුමුල්ල ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දෙන ලෙස. ඒවගේම පින්නදූව හතරවන හරස් මාර්ගය පදිංචි නිවැසියන් හතර දෙනෙක් අත්සන් කරල පත්‍රිකා භාරදීල තියෙනවා සභාවට මෙම මාර්ගය පවරාගන්නා ලෙස ඉල්ලමින්. ඒවගේම පින්නදූව තුන්වන හරස් පාරෙ වැසියන් හය දෙනෙකු ඔවුන්ගේ අදාල පෝරම පත්‍රිකා ඉදිරිපත් කරනවා එය සභාවට පවරාගෙන සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒවගේම පතිරාජ පටුමගේ වලවල් හැරිලා. ඉක්මනින්ම ප්‍රීමික්ස් ටිකක් දාන්න කියල ඉල්ලා සිටිනවා අතුරු මාර්ග වල.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

ලිපියක් තියෙනවා අවධානම් සහිත විදුලි කණුව සම්බන්ධවයි කියලා. ඇත්තටම මේකෙ රු. 75400/- ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරල තියෙනවා විදුලි බල මණ්ඩලයෙන්. මේකෙන් වන අවහිරය ගැන සොයා බලා වාර්තාවක් දෙන්න වැඩ අධිකාරිතුමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි මට තියෙනවා විශේෂ ස්තුතියක් කරන්න. ධර්මාශෝක විද්‍යාලයේ 100 වස සැමරීම වෙනුවෙන් අපි විසින් ඉල්ලන ලද ඉල්ලීම් කිහිපයකටම මේ සභාව අනුමැතිය ලබා දුන්නා. මේ සියළුම මන්ත්‍රීවරුන්ටත් නගර සභාවේ සියළුම සේවකයින්ටත් විශේෂ ස්තුතිය පිරිනමනවා. පාසල් ප්‍රජාවත් ආදිශිෂ්‍ය සංගමයත් ඒ සියළු සුභාසිංශන පුද කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. මම මේ අවස්ථාවෙදි විශේෂයෙන්ම කියා සිටිනවා කාර්නිවල් උත්සවය සඳහා ලබා දුන් ක්‍රීඩා පිටිය අයහපත් කාලගුණය නිසා යම් අසීරු තත්වයක පවතිනව. නමුත් මේය තිබුන තත්වයටත් වඩා හොඳින් පිලිසකර කරන බවට අපි පොරොන්දු වෙනවා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

ලබන්නාවූ නව වසර සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් ලේකම්තුමා ගණකාධිකාරීතුමා ඇලුළු සියළුම නිලධාරීන්ටත් සුභ අළුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

**ප. ව. 01.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| ඩී. වී. සුනිල්, | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්, |
| ලේකම්, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2013 – 04 – 29** දින,

**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**